# ශ්‍රී ලංකාවේ විගමණික ශ්‍රමිකයන් සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ අනු ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම



විදේශ රැකියා අමාත්‍යාංශය

# ශ්‍රී ලංකාවේ විගමණික ශ්‍රමිකයන් සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ අනු ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම

විදේශ රැකියා අමාත්‍යාංශය

ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන් නැවත සිය රට පැමිණිම හා සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ අනු ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම සඳහා

සහයෝගිතාවය

International
Labour
Organization

නොවැම්බර් 2015

# පිදුම

2014 වසර තුළ ශ්‍රී ලාංකික කාන්තාවන් හා පුරුෂයින් 300000 කට අධික සංඛ්‍යාවක් රැකියා සඳහා විදේශගත වීම සහ වාර්ෂිකව එසේ විදේශගත වන ශ්‍රමික සංඛ්‍යාව ඉහළ යාමත් සමග ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන් නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ අනු-ප්‍රතිපත්තිය හා ඊට සමගාමී ජාතික ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම, දිගු කලක පටන් පැවති අවශ්‍යතාවයන් ඉටු කිරීමක් සේ දැක්විය හැකිය.

විගමණික ශ්‍රමිකයන් නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ අනු ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම විදේශ රැකියා අමාත්‍යාංශයේ සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරින්ගේ අප්‍රතිහත ධෛර්යයේ ප්‍රතිඵලයකි. එසේම 2012 වසරේ සිට, විවිධ අමාත්‍යාංශ සහ ආයතන නියෝජනය කරනු ලබන පාර්ශ්වකරුවන් පුළුල් පරාසයක් මේ සඳහා සිය දායකත්වය ලබා දුනි. එකී උත්සාහයන් හා කැපවීම් වෙනුවෙන් උක්ත සියළු නිලධාරින් හට මා මාගේ හෘදයාංගම කෘතඥතාවය පුද කර සිටින අතර ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීමෙහිලා ඔවුන්ගේ අඛණ්ඩ දායකත්වය ඉදිරියටත් අපේක්ෂා කරමි.

ජාතික ක්‍රියාකාරී සැලසුම හා අනු ප්‍රතිපත්තිය සකස් කිරීමේදී ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ සහයෝගිතාවය පිළිබඳ ස්විට්සර්ලන්ත ඒජන්සිය මගින් සහයෝගය දක්වනු ලබන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 'විගමණික ශ්‍රමිකයන්ගේ යහපාලනය, ආරක්ෂාව හා ඔවුන් බලාත්මක කිරීම හරහා යහපත් සේවා තත්ත්වයන් ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ ජාතික විගමණික ශ්‍රම ප්‍රතිපත්තිය ඵළදායී ලෙස ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම' නම් ව්‍යාපෘතිය විසින් ලබා දුන් තාක්ෂණික සහාය මා ගෞරවයෙන් සිහිපත් කරමි. ශ්‍රී ලංකාවේ විගමණික ශ්‍රමිකයන් නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ මෙම අනු ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම සකස් කිරීමේදී ලබා දුන් වටිනා සහාය හා මාර්ගෝපදේශකත්වය පිළිබඳව ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දේශිය අධ්‍යක්ෂ ඩොංලින් ලී මහතාට මා මාගේ විශේෂ ස්තුතිය පුද කර සිටීමට මෙය අවස්ථාව කර ගනිමි.

මෙම අනු ප්‍රතිපත්තිය සකස් කිරීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම හා නිමා කිරීම සඳහා ලබා දුන් දායකත්වය හා කැපවීම වෙනුවෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානය කොළඹ කාර්යාලයේ ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරක ස්වෙර් රූපසිංහ මහත්මියට මා මාගේ කෘතඥතාවය පුද කර සිටින අතර මෙම අනු ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම සකස් කිරීමේදී ලබා දුන් ඉතා වටිනා දායකත්වය වෙනුවෙන් ක්‍රියේටර්ස් ෆෝරම් හි ශ්‍රියානි පෙරේරා මහත්මිය හා එම්. ටී. ලක්ෂ්මන් මහතාට විශේෂ ස්තුතිය පුද කර සිටිමි.

එසේම, මෙම අනුප්‍රාප්තිය සකස් කිරීමේ මුල් අදියරේදී ලබා දුන් වැදගත් සහාය හා මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් විදේශ රැකියා නියුක්ති ගරු අමාත්‍යතුමියගේ උපදේශිකා පද්මිණී රත්නායක මහත්මියට හා මෙම අනුප්‍රාප්තිය සකස් කොට අවසන් කිරීමේදී හා එය ක්‍රියාවට නැංවීමේදී ලබා දුන් දායකත්වය හා කැපවීම වෙනුවෙන් විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශයේ නිලධාරීන්ට මාගේ හෘදයාංගම කෘතඥතාවය පළ කර සිටිමි.

ජී. එස්. විතානගේ
ලේකම්
විදේශ රැකියා අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
2015 නොවැම්බර්

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| ALFEA | - | බලපත්‍රලාභී විදේශ රැකියා ඒජන්සිකරුවන්ගේ සංගමය |
| ASEAN | - | ශ්‍රමිකයන් යවන රටවල් |
| CoOs | - | මව්බිම වූ රටවල් |
| CoD | - | ගමනාන්ත රටවල් |
| CSO | - | සිවිල් සමාජ සංවිධාන |
| EPS | - | සේවක බලපත්‍ර ක්‍රමය |
| GCC | - | ගල්ෆ් සහයෝගිතා සභාව |
| GAD | - | ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා සංවර්ධනය |
| GDP | - | දළ දේශීය නිෂ්පාදිතය |
| IDB | - | කාර්මික සංවර්ධන මණ්ඩලය |
| ILO | - | ජාත්‍යන්තර කම්කරු සංවිධානය |
| IOM | - | ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය |
| MoU | - | අවබෝධතා ගිවිසුම |
| NGO | - | රාජ්‍ය නොවන සංවිධාන |
| SAARC | - | දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානය |
| SLBFE | - | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය |
| SIYB | - | ව්‍යාපාර ආරම්භ කිරීම හා වැඩිදියුණු කිරීම |
| TVEC | - | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම |
| TVET | - | තෘතීය හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු |

# විගමණික ශ්‍රමිකයන් නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීමපිළිබඳ අනු ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම

## පසුබිම

රැකියා නියුක්තිය සඳහා විදේශගත වීමෙන් ප්‍රතිලාභ ලබන ලොව ඇති බොහෝ රටවල් අතර ශ්‍රී ලංකාවද එකකි. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 10% ක් පමණ විදේශ රැකියා හරහා වන ප්‍රේෂණ වලින් ලැබෙන අතර එය රටේ සාම්ප්‍රදායික නොවන ආදායම් මාර්ග උතර ඉහලින්ම සිටී. 2013 වසර තුළදී විදේශ රැකියා හරහා ශ්‍රී ලංකාව ලද ප්‍රේෂණවල වටිනාකම රුපියල් මිලියන 827, 689 ක් වන අතර එය සමස්ත විදේශ විනිමය ඉපැයීම් වලින් 65% කි (සංඛ්‍යාලේඛන, 2013 මහ බැංකු වාර්තාව)

විගමණික ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු කරනු ලබන දායකත්වය සැලකිල්ලට ගත් ශ්‍රී ලංකා රජය, පූර්ව පිටපත්වීම් සේවාස්ථ නැවත සියරට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම ආදිය ඇතුලත් විගමණික චක්‍රය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණ හා වැඩසටහන් ගණනාවක් ස්ථාපිත කරන ලදී. විගමණ කළමනාකරණය සම්බන්ධයෙන් වූ මූලික ආයතනික ප්‍රතිචාරය කම්කරු අමාත්‍යාංශය විසින් සකස් කරන ලද අතර ඉන්පසු 1985 අංක 21 දරණ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ස්ථාපිත කරන ලදී SLBFE ස්ථාපිත කිරීම ශ්‍රී ලංකාවේ විගමණික ශ්‍රමික සේවය සම්බන්ධයෙන් ගනු ලැබූ වැදගත් පියවරක් වන අතර එතැන් සිට එතැන් සිට එම ආයතනය ඒ සම්බන්ධයෙන් ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කරන ලදී.

ඉන් අනතුරුව 2007 වසරේදී විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය නමින් නව අමාත්‍යාංශයක් ස්ථාපිත කරන ලද අතර එහි දැක්ම තුල සංක්‍රමණය පිළිබඳව සිය දීර්ඝකාලීන දර්ශනය පිළිබිඹු කොට ඇති ILO තාක්ෂණික සහාය මත 2008 වසරේදී සකස් කරන ලද ජාතික විගමණික ශ්‍රම ප්‍රතිපත්තිය අමාත්‍යාංශය විසින් ගනු ලැබූ ඉතා වැදගත් පියවරක් ලෙස හැඳින්විය හැකිය. ජාතික විගමණික ශ්‍රම ප්‍රතිපත්තිය (NLMP) තුළ ප්‍රධාන ප්‍රතිපත්ති සාදක තුනක් ඇතුලත් වේ. විගමණික ක්‍රියාවලිය කළමනාකරණය කිරීම, විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආරක්ෂා කිරීම හා ඔවුන් බලාත්මක කිරීම සහ විගමණය හා සංවර්ධනය සම්බන්ධ කිරීම. ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සමස්ත හා පූර්ණ ආකාරයෙන් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම NLMP විසින් ලබා දෙන අතර නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් නැවත සමාජයට ඒකාබද්ධ කිරීම හා සම්බන්ධ සියළු ක්‍රියාවලි හා ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නැවත පැමිණීමේ හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීමේ සැලසුම සකස් කිරීමේ වැදගත්කම එමගින් අවධාරණය කරයි.

## ජාත්‍යන්තර සම්මුතීන් හා ප්‍රතිපත්ති රාමුව

රැකියා සඳහා විදේශගත වීම නිවැරදි ලෙස දිශානුගත කිරීම අරමුණු කොට ගත් ජාත්‍යන්තර සම්මුති ගණනාවක් තිබේ. ඒවායින් සමහරක් වන්නේ, ආගමනය හා විගමනය සම්බන්ධ නීති, රෙගුලාසි හා ප්‍රතිපත්ති නිශ්චය කොට දක්වන 1949 C 97 දරණ රැකියා සඳහා විදේශගත වීම පිළිබඳ ILO සම්මුතිය, අපවාදාත්මක තත්වයන් තුළ විගමණය පිළිබඳ සම්මුතිය සහ නීතිවිරෝධී රැකියා නියුක්තිය, සංක්‍රමණිකයන් හොර රහසේ එහා මෙහා යාම, නීති විරෝධී රැකියා නියුක්තිය වැලැක්වීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීම ආදී සියළු නෛතික කරුණු ඇතුලත් 1975 C 143 දරණ විගමණික ශ්‍රමිකයන්ගේ සමාන අවස්ථා සහ සමාන ලෙස සැලකීම් ප්‍රවර්ධනය කිරීමේ සම්මුතිය, විගමණික ශ්‍රමික කාන්තාවන් මුහුණ දෙනු ලබන ගැටළු සම්බන්ධයෙන් සෘජු අදාලත්වයන් සහිත කාන්තාවන්ට එරෙහි සියළු අන්දමේ වෙන් කොට සැලකීම් පිටුදැකීමේ සම්මුතියේ අදාල වගන්ති (විගමණික ශ්‍රමිකයන්ගේ ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් උක්ත සම්මුතියේ පොදු නිර්දේශ 26 තුළ ඇතුළත්ය.) විගමණික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර සම්මුතිය 1990, විදේශගත වීම සඳහා සූදානම් වීම, පිටත්වීම, සංක්‍රාන්ති කාලසීමාව, රැකියා නියුක්තිය තුල වැටුප් මත සේවය කිරීමට ඇති කාලසීමාව ආදී විගමණික චක්‍රයේ සියලු අදියරයන්ට අදාල 45/158 දරණ එ.ජා. යෝජනාව. මෙම සම්මුතිය තුළ විගමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා අයිතිවාසිකම් සම්බන්ධ වගන්ති 71 ක් ඇතුළතය. රටවල් අතර ශ්‍රමිකයන් හුවමාරු කිරීමේ ක්‍රියාවලිය තුළ පෞද්ගලික අංශය ප්‍රබල ලෙස මැදිහත්ව සිටින හෙයින් 1997 පෞද්ගලික සේවා නියුක්ති ආයතන සම්මුතිය (ILO සම්මුති අංක 181) මේ සම්බන්ධයෙන් සැලකිය යුතු වැදගත්කමක් සහිත ලේඛනයකි. රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමක් හෝ සහතික නිකුත් කිරීමක් හෝ සහතික නිකුත් කිරීමක් උක්ත සම්මුතිය ප්‍රකාරව රාජ්‍ය පාර්ශවයන් විසින් සිදු කළ යුතු අතර එක්රැස්වීමට ඇති නිදහස, සාමූහික කේවල් කිරීම, සේවකයින් හට වෙනස් ආකාරයෙන් සැලකීම හා සෘජුව හෝ වක්‍රව සේවකයනගෙන් කිසිදු ගාස්තුවක් ඉල්ලීම ආදී අයිතිවාසිකම් ප්‍රවර්ධනය හෝ අයිතිවාසිකම් උල්ලංඝනයන් වැලැක්වීමට අවශ්‍ය පියවරයන් ගත යුතුය.

විගමණික ශ්‍රමිකයන් ආරක්ෂා කිරීම (විශේෂ වශයෙන් ගෘහ සේවය වැනි තත්ත්වයන් තුළ) මූලික අයිතිවාසිකම් පිළිබඳ ILO ප්‍රකාශය හා එහි පසුවිපරමෙහි පූර්විකාවේ නිශ්චිතව දක්වා ඇත.

මානව හිමිකම් පිළිබඳ කොමසාරිස් කාර්යාලයේ බලතල ප්‍රකාරව මානව හිමිකම් පිළිබඳ විශේෂ ලේකම්වරයෙකු 1999 වසරේදී පත් කරන ලදී සංවර්ධනයට විගමණික සේවකයන්ගේ දායකත්වය ඉහළ දැමීම සඳහා නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම සහ නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් හට අවශ්‍ය පුහුණුව ලබා දීම තාක්ෂණය හුවමාරු කිරීම ප්‍රවර්ධනය සහ විගමණික ශ්‍රමිකයන්ගේ මුදල් හා ජාත්‍යන්තර ව්‍යාපාරික කටයුතු ආදිය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට අදාල ප්‍රතිපත්ති සකස් කිරීම ආදී කරුණු 2000 වසරේ ජාත්‍යන්තර අපරාධ වැලැක්වීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ පරිපූරකයක් වන කාන්තාවන් හා ළමුන් ඇතුළු පුද්ගලයන් ජාවාරම් කිරීම වැලැක්වීමේ හා ඒවාට දඬුවම් පැමිණවීමේ එ.ජා. සන්ධානය, 2005 වසරේ ILO ශ්‍රම විගමණය සඳහා වූ බහු පාර්ශ්වීය සම්මුතිය හා 2005 වසරේ ශ්‍රම විගමණය පිළිබඳ ILO බහුපාර්ශ්වීය රාමුව විසින් හඳුනාගනු ලබයි.

ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, නේපාලය, පාකිස්ථානය, පිලිපීනය, ශ්‍රී ලංකාව, තායිලන්තය, වියට්නාමය සහ අබුඩාබි යන ශ්‍රමිකයන් යවන රටවල් 11ක් එක්ව 2003 වසරේදී කලාපීය වශයෙන් ආරම්භ කරන ලද කොළඹ ක්‍රියාවලිය 2003 වසරේදී බහරේන්, කුවේට්, ඕමාන්, කටාර්, සවුදි අරාබිය, එ.අ.ජ. රාජ්‍යය සහ යේමනය ආදි ශ්‍රමිකයන් භාරගන්නා රටවල් සමග 2008 වසරේදී විගමණික ශ්‍රමයට අදාල විවිධ කරුණු සාකච්ඡා කොට එම ශ්‍රමිකයන් නැවත සිය රටට පැමිණි විට ඵලදායී ලෙස සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ සැලසුම් සකස් කරන ලෙස අදාල රාජ්‍යයන් හට දන්වන ලදී. එසේම විගමණික ශ්‍රමිකයන් නැවත සිය රට පැමිණි පසු ඔවුන් ඵලදායී ලෙස නැවත සමාජයට ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් 2007 වසරේ විගමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා අභිවෘද්ධිය පිළිබඳ ASEAN ප්‍රකාශය තුළ ඇතුළත් කොට ඇති අදාල රටවල් විසින් විගමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගත යුතු ඒකාබද්ධ පියවරයන් පිළිබඳව SAARC 2014 දී සාකච්ඡා ආරම්භ කරන ලදී.

## නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්ති විධිවිධාන

නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ මෙම අනු ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශය ශ්‍රී ලංකා ජාතික විගමණික ශ්‍රම ප්‍රතිපත්තිය (2008) මගින් සපයනු ලබයි. ජාතික ප්‍රතිපත්තිය මගින් අවධාරණය කොට ඇති විගමණය හා සංවර්ධනය ඒකාබද්ධ කිරීමේ මූලධර්මය මත නැවත සිය රට පැමිණීමේ හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීමේ අනු ප්‍රතිපත්තිය සහ ජාතික ක්‍රියාකාරී සැලසුම සකස් කොට ඇත.

නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ රාජ්‍ය ප්‍රතිචාරය කෙසේ විය යුතුදැයි ජාතික විගමණික ශ්‍රමික ප්‍රතිපත්තිය විස්තර කොට ඇත්තේ "කුසලතා හුවමාරුව, ඵලදායී රැකියා නියුක්තිය හා ගැටුම් විරහිත සමාජ ඒකාබද්ධතාවයක් සඳහා අවශ්‍ය ඉඩකඩ සහිතව විගමණික ශ්‍රමිකයන්ගේ නැවත සිය රට පැමිණීම හා ඔවුන් නැවත සමාජයට ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් සිදු කළ යුතු කාර්යභාරය රජය විසින් නිසි ලෙස පිළිගත යුතුය" යනුවෙනි. "විගමණික ශ්‍රමිකයන් සඳහා ඵලදායී ලෙස නැවත සිය රට පැමිණීමේ හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීමේ සැලසුමක් රාජ්‍යය විසින් සකස් කොට ක්‍රියාත්මක කළ යුතුය" යනුවෙන් එම ප්‍රතිපත්තිය තවදුරටත් දක්වයි.

එම ප්‍රතිපත්ති රාමුව මත පදනම්ව විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශයේ ප්‍රධානත්වය මත මෙම අනු-ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම සකස් කරනු ලබයි. විගමණික ශ්‍රමිකයන්ගේ නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීමේ ප්‍රධානතම ආයතනික වගකීම දරනුයේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයයි. විගමණික ශ්‍රමිකයන් නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ යාන්ත්‍රණයන් නිර්මාණය කිරීම හා ස්ථාපිත කිරීම SLBFE විසින් සිදු කළ යුතු යැයි ජාතික විගමණික ශ්‍රම ප්‍රතිප්තතිය නිර්දේශ කොට තිබේ. එම යාන්ත්‍රණය තුළ, පිටත්වීමේදී, ශ්‍රමිකයන් භාරගන්නා රටවල විදේශ දූත මණ්ඩල කා්රයාල තුළ පිහිටුවීමට යෝජිත සම්පත් මධ්‍යස්ථාන හරහා සිදු කෙරෙන සේවාස්ථ සහාය ආදී සේවාවන් සැපයීම සහ නැවත සිය රට පැමිණි පසු "දිස්ත්‍රික් මට්ටමේ එක් වහලක් යට සියළු සේවා ස්ථාන" හරහා අවශ්‍ය සහාය ලබා දීම ඇතුලත්ය.

නැවත සිය රට පැමිණෙන ශ්‍රමිකයන් සඳහා ඵලදායී දේශීය රැකියා අවස්ථා උදා කර දීම හා රටේ සංවර්ධනය සහ සිය පෞද්ගලික අභිවෘද්ධිය සඳහා ඔවුන්ගේ කුසලතා ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවයන් ද ජාතික ප්‍රතිපත්තිය තුළ අවධාරණයට ලක් කොට තිබේ. එසේම විගමණික ශ්‍රමිකයන්ගේ පවතින ඉතිරිකිරීම් හා ආයෝජන ක්‍රම, ණය හා ව්‍යාපාර සංවර්ධන ක්‍රම සමාලෝචනයට ලක් කිරීම හා එමගින් නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන්ගේ ආර්ථික ශක්තිය තහවුරු කිරීමද මෙම ප්‍රතිපත්තිය මගින් යෝජනා කොට තිබේ. විගමණික ශ්‍රමිකයන් නැවත සියරට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ අනු ප්‍රතිපත්තියට සබඳතා ඇති වෙනත් ප්‍රධාන ප්‍රතිපත්ති වන්නේ ශ්‍රී ලංකාවේ යහපත් වැඩ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, 2006, ජාතික විගමණික සෞඛ්‍ය ප්‍රතිපත්තිය 2012, ජාතික මානව සම්පත් සංවර්ධන හා රැකියා නියුක්ති ප්‍රතිපත්තිය 2012, ශ්‍රී ලංකාවේ අවදානම්වලට ලක් වීමට ඉඩ ඇති ප්‍රජාවන් සඳහා තාක්ෂණික වෘත්තිය අධ්‍යාපන හා පුහුණු සැපයීමේ ජාතික ක්‍රමෝපාය 2010, ශ්‍රී ලංකාවේ යහපත් වැඩ ලෝකයක් සඳහා වූ එච් අයි වී හා ඒඩ්ස් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය වේ.

## අනු ප්‍රතිපත්තිය හා ජාතික ක්‍රියාකාරී සැලසුම සකස් කිරීමට පාදක වූ ක්‍රියාවලිය

1. 2012-2014 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ILO සහ විදේශ රැකියා අමාත්‍යාංශය මගින් විගමණික ශ්‍රමිකයන් නැවත සමාජයට ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය සමාජ-ආර්ථික හා මනෝවිද්‍යාත්මක සහාය ලබා දීම සඳහා කුරුණෑගල, අම්පාර හා බදුල්ල දිස්ත්‍රික්වල තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. (අඩු කුසලතා සහිත ශ්‍රමිකයන් ඉලක්ක කොට ගත්)
2. නියමු වැඩසටහන් වල නිමැවුම් සමාලෝචනයට ලක් කිරීම හා 2014 විගමනික ශ්‍රමිකයන් නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ ක්‍රමෝපායික මාර්ගෝපදේශ කෙටුම්පත සකස් කිරීම.
3. විගමණික ශ්‍රමය - නැවත සිය රට පැමිණීම සහ නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ සාහිත්‍ය සමාලෝචනයට ලක් කිරීම සහ "නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම කේන්ද්‍ර කොට ගත් රැකියා සඳහා විදේශ ගතවීම් පිළිබඳ තත්ත්වයන්ගේ සාරාංශයත්, ප්‍රතිපත්තියේ සිට ක්‍රියාවට නැංවීම දක්වා" නමින් ලේඛනයක් 2014 දී ප්‍රකාශයට පත් කිරීම.
4. ක්‍රමෝපායික දිශානතීන් සාකච්ඡා කිරීම සඳහා නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ දෙදින ජාතික සම්මන්ත්‍රණයක් පැවැත්වීම හා මැදිහත්වීම් අවශ්‍ය ක්ෂේත්‍ර පිළිබඳ අනු - ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම, 2014 ඔක්තෝබර්.
5. විගමණික ශ්‍රමය පිළිබඳ ජාතික උපදේශක කමිටුවේ නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ අනු - ප්‍රතිපත්ති රාමුව අනුමත කිරීම, 2014 නොවැම්බර්.
6. විගමණික ශ්‍රමය පිළිබඳ ජාතික උපදේශක කමිටුවේ උපදේස සහ පුලුල් පරාසයක පාර්ශ්වකරුවන්ගේ හා විද්වතුන්ගේ අදහස් ලබාගනිමින් නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුම් කෙටුම්පත සකස් කිරීම, 2015 ජුනි.
7. පාර්ශ්වකරුවන් නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳව පාර්ශ්වකරුවන් සමග එක්ව ජාතික ක්‍රියාකාරී සැලසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම SLBFE සමග එක්ව නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුම සකස් කොට අවසන් කිරීම, 2015 ඔක්තෝබර්.

## ප්‍රතිපත්ති රාමුව තුළ ගැබ්ව ඇති මූලධර්මයන්

- විගමණය සංවර්ධනයට සම්බන්ධ කිරීම හා විගමණික සේවකයන්ගේ අභිමානය තහවුරු කිරීම - දැනුම හා කුසලතා හුවමාරුව සඳහා වූ ක්‍රමවේදය සහ කුසලතා සඳහා නිසි පිලිගැනිම ලබාදීම.
- සංවර්ධනයේ කොටස්කරුවන් ලෙස විගමණික ශ්‍රමිකයන් පිලිගැනීම හා ඔවුන්ට නිසි ගෞරවය ලබා දීම.
- නැවත සිය රට පැමිණ සමාජයට අන්තර්ග්‍රහණය වූ පසු සුරක්ෂිත හා ගෞරවනීය රැකියා නියුක්තිය තහවුරු කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදිතාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සමානාත්මතාවය හා වෙන් කොට සැලකීම තුරන් කිරීම.
- සුරාකෑමට, අපයෝජනයට, බලහත්කාරයෙන් නැවත සිය රටට පිටත් කිරීමට හෝ පීඩාකාරී හෝ වේදනාත්මක අත්දැකීම්වලට ලක්වූ විගමණික ශ්‍රමිකයන් පිළිබඳව අවධාරණය හා ඔවුන් වෙත විශේෂ අවධානය යොමු කිරීම.
- විගමණික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.
- පූර්ව පිටත්වීම, සේවාස්ථ, නැවත සිය රට පැමිණීම හා අන්තර්ග්‍රහණය ආදී සංක්‍රමණ චක්‍රය තුළ ඇතුළත් පියවරයන් ප්‍රතිපත්ති රාමුව තුළ අන්තර්ගත වන අතර ඉදිරි කටයුතු සඳහා ක්‍රමෝපායන් සකස් කිරීමේදී අයිතිවාසිකම් පාදක ප්‍රවේශයක් අනුගමනය එමගින් සිදු කරනු ලබයි.
- ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලිය තුල විගමණික සේවකයන් ඇතුලත් කර ගැනීමට ඔවුන්ගේ අදහස් ලබාගැනීමට හා සහභාගිත්වයට අවස්ථාව ලබා දෙන අතර විගමණික ශ්‍රමිකයන්ගේ සාමූහික හඬට දිරි දේ.

## උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර හා ක්‍රමෝපායන් :

සමාජ, ආර්ථික, මනෝවිද්‍යාත්මක සිවිල් හා දේශපාලන අන්තර්ග්‍රහණය ආදී ක්ෂේත්‍ර ඇතුලත් සාර්වත්‍ර ප්‍රවේශයක් නැවත සිය රට පැමිණීමේ හා අන්තර්ග්‍රහණය කිරීමේ ජාතික ක්‍රියකාරී සැලසුම විසින් අනුගමනය කරන ලදී. උප ප්‍රතිපත්ති වලට සමානුපාතික වූ ක්‍රමෝපායන් ක්‍රියාකාරී සැලැස්මේ පහත සදහන් සංදර්භයන් තුල සවිස්තරව දක්වා ඇත.

## අයවැය ලේඛනය

ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය හරහා වෙන් කල අරමුදල් සහ වෙනත් ජාතික හා ජාත්‍යන්තර අරමුදල් මූලාශ්‍ර හරහා සහ යෝග්‍ය පරිදි අරමුදල් රැස්කිරීම.



# නැවත සිය රට
# පැමිණෙන්නන් සමාජයට
# අන්තර්ග්‍රහණය කිරීම

උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 1

## නැවත සිය රට පැමිණෙන්නන් සමාජයට අන්තර්ග්‍රහණය කිරීම

අන්තර්ග්‍රහණය සියලු අංශ සඳහා මූලික වන්නේ නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් සමාජයට අන්තර්ග්‍රහණය කිරීමයි. නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයා සිය රටින් පවුලෙන් ප්‍රජාවෙන් හා රටෙන් ඈත්ව වසර කිහිපයක් ගත කොට ඇත. එසේම ආගන්තුක සංස්කෘතියක හා පරිසරයක අත්දැකීම් හා නිරාවරණයන්ට ලක්ව නැවත සිය රට පැමිණෙන පුද්ගලයා තුල සිය චින්තනය, චර්යාව හා ආකල්ප සම්බන්ධයෙන් විවිධ ගට්ඨනයන් පවතී. එබැවින් සමාජ අන්තර්ග්‍රහණ වැඩසටහන් විසින් නැවත සිය රට පැමිණෙන පුද්ගලයින්ගේ කලත්‍රයන්, දරුවන් පවුල හා ප්‍රජාව වෙත ඇති විය හැකි සමාජ ප්‍රශ්ණ හා කරුණු සැලකිල්ලට ගත යුතු වේ.

නැවත අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය මන්දගාමී වීම වැලැක්වීම හා විගමණික ශ්‍රමිකයන් පිළිබඳව සුබවාදී ප්‍රතිරූපයක් ගොඩනැගීම සඳහා පවුල සහ සමාජය සවිබල ගැන්වීම අත්‍යවශ්‍යය. නැවත සිය රට පැමිණෙන පුද්ගලයින් හට ප්‍රතිලාභ අත්වන පරිදි වඩා යහපත් සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති හා වැඩසටහන් සකස් කොට ක්‍රියාත්මක කිරීම සලකා බැලිය යුතුය. එසේම සූරාකෑමට / අපයෝජනයට / පුද්ගල ජාවාරම්වලට මුහුණ දුන් පුද්ගලයින් වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්ට සංවේදී ප්‍රවේශයන් හා විශේෂ අවධානයක් යොමු වන පරිදි සමාජ අන්තර්ග්‍රහණ වැඩසටහන් නිර්මාණය විය යුතුය.

ක්‍රමෝපායන්

1.1 විගමණික ශ්‍රමිකයන් සුරක්ෂිත හා ගෞරවනීය ලෙස සිය රට පැමිණීම තහවුරු කිරීමට හා අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය යාන්ත්‍රණයක් ආයතනගත කිරීම.

1.2 විගමණික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් සුභවාදී ප්‍රතිරූපයක් ගොඩනැගීම සඳහා වූ පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

1.3 නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

1.4 ළමා සංවර්ධනයට ප්‍රමුඛස්ථානය ලබා දෙමින් විගමණික ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා සුභසාධන හා ආරක්ෂණ ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම.

1.5 විගමණික ශ්‍රමිකයන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

## උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 1 : නැවත සිය රට පැමිණෙන්නන්ගේ සමාජයට නැවත අන්තර්ග්‍රහණය කිරීම

අරමුණ : විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවාන්විත ලෙස නැවත සිය රටට පැමිණීම හා ඔවුන් ආරක්ෂිත හා සුහදශීලී පවුල හා ප්‍රජා පරිසරයන් වෙත ඵලදායී ලෙස නැවත ඒකාබද්ධ කිරීම

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක ( 2016 - 2018 ) | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 වන ශිල්ප ක්‍රමය : විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවනීය ලෙස නැවත සිය රට පැමිණීම හා සමාජයට ඒකාබද්ධ කිරීම තහවුරු කිරීම සඳහා වන යාන්ත්‍රණය ආයතනගත කිරීම | | | | | | | | |
| 1.1 ආයතනගත යාන්ත්‍රණ හරහා විගමණික ශ්‍රමිකයන් හට සෞඛ්‍ය, මනෝ සමාජීය සහාය, කුසලතා සංවර්ධනය, මුදල් හා නිවාස ණය ආදී පහසුකම් හා සේවාවන්ට ප්‍රවේශය ලැබීම. | 1.1 SLBFE හා වෙනත් අදාල ආංශික ආයතන හා ඒවායේ ප්‍රතිපත්ති සහ සැලසුම් අතර සබඳතා ගොඩනැගී තිබීම. | 1.1 ප්‍රමාණවත් කාර්ය මණ්ඩල සහිතව SLBFE ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල තුළ විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවනීය ලෙස නැවත සිය රට පැමිණීම හා සමාජයට ඒකාබද්ධ කිරීම පහසු කිරීම සඳහා වූ විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීම. | 1.1 නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයින් පිළිබඳ දත්ත පද්ධතියක් කොට්ඨාශ මට්ටමින් ස්ථාපිත කොට පවත්වා ගෙන යනු ලැබේ.<br><br>1.1 ආංශික ආයතන සමග සහයෝගිතාවය පුලුල් කිරීම සඳහා අවශ්‍ය පද්ධති සහ කාර්ය පටිපාටි සකස් කොට ඇත.<br><br>1.1 සම්බන්ධීකරණ කමිටු අවම වශයෙන් මසකට වරක්වත් රැස් වන අතර පාර්ශ්වකරුවන්ගෙන් 70% ක් පමණ ඒවාට සහභාගී වේ. | MoFE, SLBFE (ප්‍ර. ආ.)<br><br>සෞඛ්‍ය අමාත්‍යංශය (ප්‍ර. ආ.)<br><br>පළාත් සභා සහ පළාත් පාලන ආයතන (ස. ආ.)<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල (ස. ආ.)<br><br>ප්‍රා. ලේ. කාර්යාල (ස. ආ.) | X | | | |
| | 1.2 ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් "සියළු සේවා එක් හලක් යට" මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ. | 1.2 ආර්ථික/සෞඛ්‍ය /මුල්‍ය/කුසලතා පුහුණු ආදී සේවාවන් පිළිබඳ තොරතුරු ලබාදීම සඳහා දිස්ත්‍රික් / ප්‍රා.ලේ. කාර්යාල මට්ටමින් "එක් වහලක් යට සියලු සේවා" මධ්‍යස්ථාන නැවත ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම. | 1.2 "එක් වහලක් යට" සියළු සේවා මධ්‍යස්ථාන වෙතින් නැවත සිය රට පැමිණි විගමණික ශ්‍රමිකයන් 5000 ක් සේවා ලබා ගෙන ඇත. | | X | X | X | |
| | 1.3 කොට්ඨාශ හා ග්‍රා.නි. කොට්ඨාශ මට්ටමින් සම්බන්ධීකරණ කමිටු, ස්ථාපිත කොට ඵලදායී සේවා සපයයි. | 1.3 නැවත සමාජයට ඒකාබද්ධ කිරීම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ප්‍රා.ලේ. කොට්ඨාශ මට්ටමින් (ග්‍රා.නි. කොට්ඨාශ සම්බන්ධ කරගනිමින්) සියළු පාර්ශවකරුවන් ඇතුළත් සම්බන්ධීකරණ කමිටු ස්ථාපිත කිරීම. | 1.3 ද්වි වාර්ෂික පදනමින් පවැතවෙන සම්බන්ධීරණ කමිටු හරහා බොහෝ ගැටලු විසඳීමට හැකිව තිබේ. | | X | X | X | |

## උප ප්‍රතිප්ති ක්ෂේත්‍රය 1 : නැවත සිය රට පැමිණෙන්නේ සමාජයට නැවත අන්තර්ග්‍රහණය කිරීම

අරමුණ : විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවාන්විත ලෙස නැවත සිය රටට පැමිණීම හා ඔවුන් ආරක්ෂිත හා සුහදශීලී පවුල හා ප්‍රජා පරිසරයන් වෙත එලදායි ලෙස නැවත ඒකාබද්ධ කිරීම

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක ( 2016 - 2018 ) | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 වන ශිල්ප ක්‍රමය : විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවනීය ලෙස නැවත සිය රට පැමිණීම හා සමාජයට ඒකාබද්ධ කිරීම තහවුරු කිරීම සඳහා වන යාන්ත්‍රණය ආයනගත කිරීම | | | | | | | | |
| | 1.4 විදේශ රැකියා කොට නැවත සිය රට පැමිණෙන අය සඳහා පහසුවෙන් ලබා ගත හැකි නිවාස ණය යෝජනා ක්‍රමයක් ස්ථාපිත කොට ඇත. | 1.4 විගමනික ශ්‍රමිකයන් සඳහා දැනට ඇති නිවාස ණය වැඩසටහන සමාලෝනය කිරීම හා ඒවා වඩා පහසු කිරීම. | 1.4 නිවාස ණය 5000ක් සදහා ලබා දි ඇති අතර ඒවා පිලිබඳ පසුවිපරම් කටයුතු සිදු කරනු ලබයි. | | X | | | |
| | 1.5 පූර්ව පිටවත්වීම් පුහුණුව, නැවත සිය රට පැමිණීම හා නැවත ඒකාබද්ධ කිරීම් සැලසුම් කිරිම පිළිබඳ සැසියක් ඇතුලත් කොට ඇත. | 1.5 සියළු පූර්ව පිටත්වීම් පුහුණු වැඩසටහන් සමාලෝචනය කිරීම සහ නැවත සිය රට පැමිණීම හා ඒකාබද්ධ කිරිම පිළිබඳ තොරතුරු පත්‍රිකාවක් හරහා විදේශගත වීමට අපේක්ෂාවෙන් සිටින පුද්ගලයින් හට වැඩිපුර තොරතුරු ලබාදීම හා ඔවුන් සංවේදීකරණය කිරීම. | 1.5 නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් තමන් හට නැවත පැමිණීමේදී හා සමාජයට ඒකාබද්ධ වීමේදී ගැටළුවක් ඇති නොවුනු බව පවසයි.<br><br>1.5 නැවත සිය රට පැමිණි විගමණික ශ්‍රමිකයන්ගෙන් 60 % ක ප්‍රමාණයක් එසේ කිරීමේදී අදල රටේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවාවන් ලබා ගෙන ඇත. | | X | | | |
| | 1.6 නැවත සිය රට බලා සහ විගමණික ශ්‍රමිකයන් හට නැවත සමාජයට ඒකාබද්ධ වීම පිළිබඳ තොරතුරු ලබා දිම සඳහා අවශ්‍ය යාන්ත්‍රණයන් ශ්‍රී ලංකා දූත කාර්යාල වල ස්ථාපිත කොට ඇත. | 1.6 ගැටළුවකින් තොරවන නැවත සිය රට පැමිණීම පහසු කිරීම සඳහා අත් පත්‍රිකා සහ වෙනත් මාධ්‍ය හරහා නැවත සිය රට පැමිණීමට අපේක්ෂාවෙන් පසුවන විගමණික ශ්‍රමිකයන් සඳහා සමාජයට ඒකාබද්ධ වීම පිළිබඳ තොරතුරු සැපයීම.<br><br>1.6 නැවත සිය රට පැමිණීමේ වගකීම් පිළිබඳ වගන්ති රැකියා නියුක්ති කොන්ත්‍රාත්තුව තුල ඇතුලත් කිරීම. | 1.6 නැවත සිය රට පැමිණි විගමණික ශ්‍රමිකයන් සැලකිය යුතු සංඛ්‍යාවක් අදල රටේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවාවන් ලබා ගෙන ඇත. | | | X | X | |

## උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 1 : නැවත සිය රට පැමිණෙන්නන්ගේ සමාජයට නැවත අන්තර්ග්‍රහණය කිරීම

අරමුණ : විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවාන්විත ලෙස නැවත සිය රටට පැමිණීම හා ඔවුන් ආරක්ෂිත හා සුහදශීලී පවුල හා ප්‍රජා පරිසරයන් වෙත ඵලදායි ලෙස නැවත ඒකාබද්ධ කිරීම

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක ( 2016 - 2018 ) | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 වන ශිල්ප ක්‍රමය : විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවනීය ලෙස නැවත සිය රට පැමිණීම හා සමාජයට ඒකාබද්ධ කිරීම තහවුරු කිරීම සඳහා වන යාන්ත්‍රණය ආයනගත කිරීම | | | | | | | | |
| | 1.7 බාධාවකින් තොරව නැවත සිය රට බලා යාම තහවුරු කිරීම සඳහා රැකියා කොන්ත්‍රාත් අධීක්ෂණය කිරීමට SLBFE සුපරීක්ෂාව යටතේ රැකියා ඒජන්සි විසින් ක්‍රියාවලි ස්ථාපිත කොට ඇත. | 1.7 නැවත සිය රට බලා යාම හා සිය රට බලා පිටත් කිරීම පිලිබඳ වගන්ති ඇතුලත් රැකියා කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම. (සේවකයා හා සේව්‍යයාගේ වගකීම් විශේෂයෙන්ම ගෘහ සේවිකාවන් සඳහා) | 1.7 නැවත සිය රට පැමිණීම පිලිබඳව සේවකයාගේ හා සේව්‍යයාගේ වගකීම රැකියා නියුක්ති කොන්ත්‍රාත්තුව තුළ ඇතුලත් කිරීම. | | | x | x | |
| | 1.8 සේවායෝජකයාගේ වැරදි හේතුවෙන් තම කොන්ත්‍රාත් කාලය සම්පූර්ණ කිරීමට පෙර නැවත සිය රට පැමිණීමට හේතු වූ විගමණික ශ්‍රමිකයන් ගැටළුවකින් තොරව එසේ පැමිනෙන බව තහවුරු කෙරෙන ක්‍රියාවලිය ස්ථාපිත වී ඇත. | 1.8 නිසි කලට පෙර නැවත සිය රට පැමිණෙන් න් හට ගැටළුවලට මැදි වීමට ලක් නොවී නැවත පැමිණීම පහසු කිරීම සඳහා වන ක්‍රියාවලියක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග එක්ව ස්ථාපිත කිරීම. | 1.8 සේවායෝජකයාගේ වැරදි හේතුවෙන් තම කොන්ත්‍රාත් කාලය සම්පූර්ණ කිරීමට පෙර නැවත සියරට පැමිණීමට හේතු සහ SLBFE වගකීම් අදාල කෙටුම්පත් නිකුත් කිරීම. | | | x | | |

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 1 : නැවත සිය රට පැමිණෙන්නේ සමාජයට නැවත අන්තර්ග්‍රහණය කිරීම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අරමුණ : විගමනික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවාන්විත ලෙස නැවත සිය රටට පැමිණීම හා ඔවුන් ආරක්ෂිත හා සුහදශීලී පවුල හා ප්‍රජා පරිසරයන් වෙත එලදායි ලෙස නැවත ඒකාබද්ධ කිරීම | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක ( 2016 - 2018 ) | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 2 වන ශිල්ප ක්‍රමය : විගමණී ශ්‍රමිකයන්ගේ සුභවාදී ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා පුලුල් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | | | | | | | | |
| 2. විගමණික ශ්‍රමිකයන් පිළිබඳ සුබවාදී ප්‍රතිරූප ගොඩනැගීමේ පුලුල් වැඩපිලිවෙල. | 2.1 විගමණික ශ්‍රමිකයන් පිළිබඳ සුභවාදී ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ හා සමාන ආයතන සමග අවබෝධතා ගිවිසුමක් ස්ථාපිත කොට ඇත.<br><br>2.1 විගමණික ශ්‍රමිකයන්ගේ දායකත්වය පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කිරීම. | 2.1. විගමණික ශ්‍රමිකයන් විසින් සිදු කරනු ලබන සමාජීය සහ ආර්ථික දායකත්වය පිළිබඳ මාධ්‍ය වැඩසටහන් ඇරඹීම සදහා විද්‍යුත් මාධ්‍ය අමාත්‍යංශය සහ වෙනත් මාධ්‍ය ආයතන සමග එකගතාවයක් ගොඩනගා ගැනීම. | 2.1 ජනප්‍රිය මාධ්‍ය වැඩසටහන්/ටෙලි නාට්‍ය / ගුවන්විදුලි වැඩසටහන් හරහා විගමණික ශ්‍රමිකයින්ගේ සංවර්ධනය දායකත්වය හුවා දැක්වීම. | ජනමාධ්‍ය අමාත්‍යංශය<br><br>MoFE, SLBFE (ප්‍ර. ආ.)<br><br>පළාත් සභා හා පළාත් පාලන ආයතන (ස. ආ.)<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල (ස. ආ.)<br><br>ප්‍රා. ලේ. කාර්යාලය (ස. ආ.)<br><br>සිවිල් සමාජය (ස. ආ.)<br><br>ගුවන් තොටපොල හා ගුවන් සේවා අධිකාරිය (ස.ආ.) | | x | | |
| | 2.2 විගමණික ශ්‍රමිකයන් සඳහා වරප්‍රසාද ප්‍රදානය කිරීම සඳහා අදාල රජයේ ආයතන හා එක්ව SLBFE විසින් ස්ථාපිත කරනු ලබන විශේෂ ඒකකයේ පද්ධති හා ක්‍රියාවලී ඇති කිරීම. | 2.2 ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තා තුළ විගමණික ශ්‍රමිකයන්ගේ දායකත්වය පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීම සඳහා එම දෙපාර්තමේන්තුව සමග ගිවිසුමක් ඇති කර ගැනීම. | 2.2 ජාතික සංඛ්‍යාලේඛන (මහ බැංකු වාර්තා, සංඛ්‍යා ලේඛන වාර්තා ශ්‍රම බලකා සහභාගිත්ව සංගණන) නල විගමණික ශ්‍රමික දායකත්වය ඇතුලත් කිරීම. | | | | | |
| | | 2.3 රාජ්‍ය අනුග්‍රහය ඇතිව ජාත්‍යන්තර විගමණික ශ්‍රමික දිනය සැමරීම.<br><br>2.3 නිශ්චිත නිර්නායකයන් මත පදනම්ව විගමණික ශ්‍රමිකයන් සඳහා විශේෂ හැඳුනුම්පත් ලබා දීම. | 2.3 දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉසව් කැලැන්ඩර් වල තොරතුරු ඇතුලත් කිරීම.<br><br>2.3 ජාත්‍යන්තර විගමණික ශ්‍රමික දිනය සැමරීමේදී සිවිල් සමාජයේ සහභාගිත්වය හා දායකත්වය ලබා ගැනීම. | | | | | |

**උප ප්‍රතිප්ති ක්ෂේත්‍රය 1 : නැවත සිය රට පැමිණෙන්නේ සමාජයට නැවත අන්තර්ග්‍රහණය කිරීම**

**අරමුණ : විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවාන්විත ලෙස නැවත සිය රටට පැමිණීම හා ඔවුන් ආරක්ෂිත හා සුහදශීලී පවුල හා ප්‍රජා පරිසරයන් වෙත ඵලදායි ලෙස නැවත ඒකාබද්ධ කිරීම**

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක ( 2016 - 2018 ) | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| 2 වන ශිල්ප ක්‍රමය : විගමණි ශ්‍රමිකයන්ගේ සුභවාදී ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා පුලුල් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | | | | | | | | |
| | | 2.3 ගුවන්තොටුපොළේදී ඇතිවන දුෂ්කරතා වලක්වමින් විගමණික ශ්‍රමිකයන් හට නැවත සිය රට පැමිණීමේදී ගැටලුවකින් තොරව එම කටයුතු සිදු කර ගැනීම සඳහා අවශ්‍ය විශේෂ පිළිැනීමේ කවුන්ටර ඇති කිරීම.<br><br>2.3 ප්‍රේෂණ මත පදනම්ව වාහන (තීරු බදු රහිත) බලපත්‍ර ලබාදිමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.<br><br>2.3 ස්වයං රැකියා හා ජීවනෝපාය කටයුතු සඳහා අවශ්‍ය උපකරණ ගෙන්වීම සඳහා නැවත සිය රට පැමිණෙනන්නන් හට සහන ලබා දීම.<br><br>2.3 අඩු කුසලතා කාණ්ඩ විසින් නිල ප්‍රවාහ හරහා එවන ලද ඉහළම ප්‍රේෂණ සඳහා ත්‍යාග ලබා දීමේ ක්‍රමවේදයක් ආරම්භ කිරීම. | 2.3 ගුවන් තොටුපලට පැමිණීමේදී විගමණික ශ්‍රමිකයන් හට විශේෂ සැලකිලි පිරිනැමේ.<br><br>2.3 වාර්ෂිකව විගමණික ශ්‍රමිකයන් හට ලැබෙන තීරුබදු රහිත වාහන බලපත්‍ර සංඛ්‍යාව.<br><br>2.3 විශේෂ බලපත්‍ර මත විගමණික ශ්‍රමිකයන් විසින් ආනයනය කරනු ලැබූ උපකරණ සංඛ්‍යාව හා වර්ග. | | | | | |

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 1 : නැවත සිය රට පැමිණෙන්නේ සමාජයට නැවත අන්තර්ග්‍රහණය කිරීම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අරමුණ : විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවාන්විත ලෙස නැවත සිය රටට පැමිණීම හා ඔවුන් ආරක්ෂිත හා සුහදශීලී පවුල හා ප්‍රජා පරිසරයන් වෙත එලදායී ලෙස නැවත ඒකාබද්ධ කිරීම | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක ( 2016 - 2018 ) | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 3 වන ශිල්ප ක්‍රමය : විගමණික ශ්‍රමිකයන් සඳහා වන සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීම | | | | | | | | |
| 3. නැවත රට සිට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් සඳහා රක්ෂණ හා සමාජ ආරක්ෂණ වැඩසටහන්. | 3.1 විගමණික මෙහෙයුම් සඳහා රක්ෂණ වැඩසටහන් පහසුවෙන් ප්‍රවේශ විය හැක. | 3.1 විගමණික ශ්‍රමිකයන්ට හිතවාදී හා ඔවුන්ට වැඩි ප්‍රතිලාභ අත්වන පරිදි දැනට ඇති රක්ෂණ යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම. | 3.1 වාර්ෂිකව විගමණික ශ්‍රමිකයන් 2 % සංඛ්‍යාවක් විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක වේ. | MoFE<br>SLBFE (ප්‍ර. ආ.)<br>මුදල් අමාත්‍යාංශය (ප්‍ර. ආ.)<br>ප්‍රතිපත්ති සැලසුම් අමාත්‍යාංශය (ප්‍ර. ආ.)<br>බැංකු (ස. ආ.)<br>මූල්‍ය ආයතන (ස. ආ.)<br>රක්ෂණ සමාගම් (ස. ආ.)<br>රක්ෂණ මණ්ඩලය | X | X | X | |
| | 3.2 අඩු කුසලතා සහිත විගමණික ශ්‍රමිකයන් හා ගෘහ සේවිකාවන් සඳහා ප්‍රතිලාභ අත්වන අන්දමේ සමාජ ආරක්ෂණ ක්‍රමයක්, වැටුප් විශ්‍රාම ක්‍රමයක් ස්ථාපිත කිරීම. | 3.2 අඩු කුසලතා සහිත ශ්‍රමිකයන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමයක් / විශ්‍රාම වැටුප් ක්‍රමයක් ස්ථාපිත කිරීම. | | | X | | X | |
| 4 වන ශිල්ප ක්‍රමය : ළමා සංවර්ධනය කේන්ද්‍ර කොටගත් විගමණික ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා සුහසාධන සහ ආරක්ෂක වැඩසටහන් | | | | | | | | |
| 4. විගමණික ශ්‍රමිකයන්ගේ ළමුන් හා පවුලේ සාමාජිකයන් වඩා හොඳ ජීවන තත්ත්වයක් සහ සේවාවක් අත් විඳී. | 4.1 දිස්ත්‍රික් මට්ටමින් විගමණික ශ්‍රමික පවුල්වල තොරතුරු හා දත්ත පද්ධති සකස් කොට ඒ සඳහා ගැලපෙන වැඩසටහන් සකස් කෙරේ. | 4.1 විගමණික ශ්‍රමික පවුල් පැතිකඩයන් සකස් කිරීම හා අවධානය අවශ්‍ය කරුණු හඳුනා ගැනීම. | 4.1 පවුල් පැතිකඩයන් පිළිබඳ පූර්ණ විස්තර ඇත.<br>4.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සේවයේ යෙදී සිටින සංවර්ධන නිලධාරීන් සේවා නාමාවලිය භාවිතා කරයි.<br>4.1 දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල තුල සේවා සපයන්නන්ගේ නාමාවලී ඇත. | MoFE<br>SLBFE (ප්‍ර. ආ.)<br>පළාත් සභා (ස. ආ.)<br>දිස්ත්‍රික් ලේ කා (ස. ආ.)<br>ප්‍ර. ලේ. කා (ස. ආ.)<br>පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව (ස. ආ.)<br>ළමා කටයුතු අමාත්‍යාංශය (ස. ආ.) | | X | X | |

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 1 : නැවත සිය රට පැමිණෙන්නේ සමාජයට නැවත අන්තර්ග්‍රහණය කිරීම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අරමුණ : විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවාන්විත ලෙස නැවත සිය රටට පැමිණීම හා ඔවුන් ආරක්ෂිත හා සුහදශීලී පවුල හා ප්‍රජා පරිසරයන් වෙත ඵලදායි ලෙස නැවත ඒකාබද්ධ කිරීම | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක ( 2016 - 2018 ) | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 4 වන ශිල්ප ක්‍රමය : ළමා සංවර්ධනය කේන්ද්‍ර කොටගත් විගමණික ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා සුහසාධන සහ ආරක්ෂක වැඩසටහන් | | | | | | | | |
| | 4.2 සහාය අවශ්‍ය පවුල්වල සාමාජිකයන් සහ ළමුන් හඳුනා ගැනීමට හා ඔවුන් තුළ සේවාවන් වෙත යොමු කිරීමට සංවර්ධන නිලධාරීන්ට හැකිය.<br><br>4.2 විගමණික ශ්‍රමිකයන්ගේ ළමුන් සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා වන දිස්ත්‍රික් මට්ටමේ ඒකාබද්ධතාවයන් හා සම්බන්ධීකරණයන් ගොඩ නැගේ. | 4.2 යොමු කිරීම් සඳහා අවශ්‍ය රාජ්‍ය සහ පෞද්ගලික සහාය සේවා පිළිබඳ නාමාවලියක් සකස් කිරීම.<br><br>4.2 සංවර්ධන නිලධාරීන් විගමණික ශ්‍රමික පවුල් සමග සම්බන්ධ වී ගැටළු හඳුනාගෙන ඒවා අදාල යාන්ත්‍රණ වෙත යොමු කරයි.<br><br>4.2 සංවර්ධන නිලධාරීන් සඳහා ළමුන් උපද්‍රවයන්ට පාත්‍ර වීමට ඇති ඉඩකඩ පිළිබඳ ලකුණු කාඩ්පතක් භාවිතා කිරීම හඳුන්වා දීම. | 4.2 ස්වකීය සුහසාධන හා ආරක්ෂණ ගැටළු සඳහා පිලියම් සපයා ගැනීම සඳහා 25%ක විගමණික ශ්‍රමිකයන් ප්‍රමාණයක් අදල සේවා වෙත ප්‍රවේශ වී ඇත.<br><br>4.2 ළමුන් උපද්‍රවයන්ට පාත්‍ර වීමට ඇති ඉඩකඩ පිළිබද ලකුණු කාඩ්පත් බහුලව භාවිතා කිරීම. | ළමා ආරක්ෂක අධිකාරිය (ස. ආ.)<br><br>NGO / INGO (ස. ආ.) | | X | X | |
| | | 4.3 විගමණික ශ්‍රමිකයන්ගේ ළමුන්ගේ සුහසාධනය හා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමෙ සියළු පාර්ශ්වකරුවන් හා එක්ව ඒකාබද්ධ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | | | | X | X | |

## උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 1 : නැවත සිය රට පැමිණෙන්නේ සමාජයට නැවත අන්තර්ග්‍රහණය කිරීම

අරමුණ : විගමණික ශ්‍රමිකයන් ආරක්ෂාකාරී හා ගෞරවාන්විත ලෙස නැවත සිය රටට පැමිණීම හා ඔවුන් ආරක්ෂිත හා සුහදශීලී පවුල හා ප්‍රජා පරිසරයන් වෙත ඵලදායී ලෙස නැවත ඒකාබද්ධ කිරීම

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක ( 2016 - 2018 ) | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| 5 වන ශිල්ප ක්‍රමය : විගමණික ශ්‍රමිකයන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම | | | | | | | | |
| 5. නිසිකලට පෙර පාසල් හැර යන ළමුන් සඳහා උපදේශනය සපයා දි ප්‍රධාන ධාරාවේ වෘත්තිය අධ්‍යාපන පද්ධතිය වෙත උකහාගෙන තිරසාර රැකියා නියුක්තිය සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කෙරේ. | 5.1 පුහුණු සිසු උපදේශකයන් පාසල් තුළ සිටී. | 5.1 පාසල් තුළ සිසු උපදේශකයින් පත් කිරීම හා සහාය අවශ්‍ය සහ මානසික සංකූලතාවයට පත් සිසුන් හට අවශ්‍ය උපදේශනය සපයා දීම. | 5.1 ළමුන් 1000 අධ්‍යාපනයට සම්බන්ධ උපදේශන සේවාවන් වෙත ප්‍රවේශ වී ඇත. | MoFE<br>SLBFE (ප්‍ර. ආ.)<br>ජාතික හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු (ප්‍ර. ආ.)<br><br>පළාත් සභා (ස. ආ.) | | X | X | |
| | 5.2 විගමණික ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා අධ්‍යාපනික ශිෂ්‍යත්ව සඳහා අවශ්‍ය සහාය හා ක්‍රියාවලී ස්ථාපිත කොට ඇත. | 5.2 අවශ්‍ය සිසුන් සඳහා අධ්‍යාපනික ශිෂ්‍යත්ව වැඩසටහන් ස්ථාපිත කිරීම. | 5.2 විගමණික ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා ඇති ළමුන් 3000 සඳහා වසරකට ශිෂ්‍යත්ව ලබා දී ඇත. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල (ස. ආ.)<br><br>ප්‍රා. ලේ. කා. (ස. ආ.)<br><br>පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව (ස. ආ.) | X | X | X | |
| | 5.3 විගමණික ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයින් අරමුණු කොටගත් වෘත්තිය මාර්ගෝපදේශ සේවාවක් ඇත. | 5.3 නිසි කලට පෙර පාසල් හැර යන ළමුන් සඳහා වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන තුළදී කුසලතා සපයා දීම මෙන්ම මූල්‍ය සහාය සහ වෘත්තිය මාර්ගෝපද්දෙශකත්වය ලබා දීම. | 5.3 1500 පවුල්වල සාමාජිකයන් කුසලතා සංවර්ධන හා රැකියා නියුක්ති වැඩසටහන් වලට සම්බන්ධ වී ඇත. | සමාජ සේවා දෙපාර්තමේන්තුව (ස. ආ.)<br><br>කාන්තා කටයුතු අමාත්‍යාංශය (ස. ආ.)<br><br>ජාතික ළමාරක්ෂක අධිකාරිය (ස. ආ.)<br><br>NGO / INGO (ස. ආ.)<br><br>සිවිල් සමාජය (ස. ආ.) | | X | X | |




නැවත සිය රට පැමිණෙන
පුද්ගලයින් ආර්ථීකයට
ඒකාබද්ධ කිරීම

උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 2

## නැවත සිය රට පැමිණෙන පුද්ගලයින් ආර්ථිකයට ඒකාබද්ධ කිරීම

ආර්ථික අන්තර්ග්‍රහණය තුල ඇතුලත් වන්නේ විගමණික ශ්‍රමිකයන් නැවත සේවයේ යෙදවීම ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායට නැවත අවතීර්ණ කරවීමට අවශ්‍ය කුසලතා සංවර්ධනයට අදාල කරුණුය. එසේම ඉතිරි කිරීම, ආයෝජනය කිරීම, නැවත සිය රට පැමිණොන්නට හා ඔහුගේ / ඇයගේ පවුලේ සාමාජිකයන් හට තිරසාර ආදායම් මාර්ග ප්‍රවර්ධනය මෙන්ම ඔවුන්ගේ නිවස ඉදිකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම අවශ්‍යය. තවත් අත්‍යවශ්‍ය කරුණක් වන්නේ අධික පරිභෝජන රටාවන්ගෙන් ඈත්ව ඉතිරි කිරීම් සඳහා දිරිගැන්වීමයි. රජය, පෞද්ගලික ආයතන සහ සිවිල් සංවිධාන / වෘත්තීය සමිති මගින් සිදු කෙරෙන සේවා සැපයුම් හරහා ඵලදායි ආර්ථික අන්තර් ග්‍රහණය මෙම ක්‍රමෝපායන් තුළ අන්තර්ගතය. කුසලතා තක්සේරු කිරීම හා ඉහළ දැමීම, පූර්ව ඉගෙනුම් සඳහා පිළිගැනීම ලබාදීම සහ ශ්‍රේණිගත කිරීම හා සහතිකකරණය ආදිය නැවත සේවයේ යෙදීමට හා ඉහළ වැටුප් ලබාගැනීමට අවශ්‍ය සහාය ලබා දේ. ශ්‍රමිකයන් යවන හා ලබන රටවල් වල කුසලතා ගිවිසුම් පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීම හඳුන්වාදීම, සංක්‍රමණය පිලිබඳ කලාපීය රාමු තුළ අවධාරණය කොට ඇත.

ක්‍රමෝපායයන්

2.1 පිටත්වීමට පෙර හා නැවත සිය රට පැමිණි පසු විගමණික ශ්‍රමිකයකන්ගේ තත්ව ප්‍රමිතිකරණය සහ කුසලතා සහතික කිරීම.

2.2 විගමණික සේවකයන් අතර ඉතිරිකිරීම් ආයෝජන හා මූල්‍ය කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම.

2.3 නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන්.

2.4 රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය හරහා සියළු වර්ගවල කුසලතා සහිත විගමණික ශ්‍රමිකයන් සඳහා දේශීය රැකියා නියුක්ති කරවීමේ වැඩසටහන් සකස් කිරීම.

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 2 : නැවත සිය රට පැමිණෙන්නන් ආර්ථිකයට ඒකාබද්ධ කිරීම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඉලක්කය : රැකියා සඳහා අවශ්‍ය කුසලතා ලබා ගැනීමට, ව්‍යවසායකත්ව හැකියාවන් සංවර්ධනය කර ගැනීමට සහ රැකියාවල හා තිරසාර ජීවනෝපාය ක්‍රියාකාරකම්වල නියැලීමට විගමණික ශ්‍රමිකයන් හට අවශ්‍ය සහාය ලබා දේ | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 1 වන ශිල්ප ක්‍රමය : පිටත්වීමට පෙර හා නැවත සිය රට පැමිණි පසු විගමණික ශ්‍රමිකයකන්ගේ තත්ව ප්‍රමිතිකරණය සහ කුසලතා සහතික කිරීම | | | | | | | | |
| 1. ඉහල කුසලතා සහිත ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන් හට ගුණාත්මක රැකියා හා ඉහළ වැටුප් ලැබේ. | 1.1 පිටත්වීමට පෙර හා නැවත සිය රට පැමිණීමෙන් පසු කුසලතා වර්ගීකරණය කිරීම හා කුසලතා තක්සේරුව හා සහතිකකරණය ප්‍රමිතිගත කිරීම සඳහා වන යාන්ත්‍රණයන්. | 1.1 පූර්ව පිටත්වීම් අදියරේදී කුසලතා තක්සේරු සහ සහතිකකරණ (සත්කාරක රටේ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි) (ජාතික වෘත්තීය යෝග්‍යතා 3 මට්ටම) ක්‍රමවේදය.<br><br>1.1 පූර්ව දැනුම හා කුසලතා ඔප් නංවා ගැනීම හඳුනාගැනීම සඳහා වන තොරතුරු කවුළුවක් ගුවන් තොටුපොල පරිශ්‍රයේ ස්ථාපිත කිරීම. | 1.1 500 සේවකයින් ඉහළ ඉල්ලුමක් ඇති රැකියා (23 රැක බලාගැනීම, ඉදිකිරීම්, කෘෂිකාර්මික වැඩ කටයුතු හා ගෘහස්ත සේවා) සඳහා එක් එක් රටට සුවිශේෂී කුසලතා ප්‍රමිතීන් පිලිබඳ සිදු කරන ලද නව යාවත්කාලීන කිරීම් සංඛ්‍යාව.<br><br>1.1 නැවත සියරට පැමිණි විගමණික ශ්‍රමිකයන් 2% ඉහළ කුසලතා හා සහතිකකරණය ලබා ගෙන ඇත. | MoFE<br><br>SLBFE (ප්‍ර. ආ.)<br><br>වෘත්තිය පුහුණු අධිකාරිය (ස. ආ.)<br><br>ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (ස. ආ.) | | x | x | |
| | 1.2 ද්විපාර්ශ්වික / බහුපාර්ශ්වික කුසලතා පිලිගැනීමේ ගිවිසුම් ක්‍රියාත්මකයි. | 1.2 ගමනාන්ත රටවල් සමග අන්‍යොන්‍ය කුසලතා පිලිගැනීම් ගිවිසුම් / අවම කුසලතා අවශ්‍යතා ගිවිසුම් වලට එළඹීම. | 1.2 වාර්ගිකව අත්සන් කොට පසුවිපරමට ලක් කරනු ලබන අන්‍යෝන්‍ය කුසලතා පිලිගැනීමේ ගිවිසුම් සංඛ්‍යාව. | | | | x | |
| 2 වන ශිල්ප ක්‍රමය : විගමණික ශ්‍රමිකයන් අතර ඉතිරි කිරීම්, ආයෝජන හා මූල්‍ය කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම | | | | | | | | |
| 2. අධික පරිභෝජන රටාව වෙනුවට ඉතිරි කිරීම් හා ආයෝජනය කිරීම් වෙත ප්‍රවේශය. | 2.1 විගමණික ශ්‍රමිකයන් අරමුණු කොට ගත් පූර්ණ මූල්‍ය කළමනාකරණ හා බැංකු තොරතතුරු ලබා ගත හැකිය. | 2.1 ඉතිරි කිරීම් හා බැංකු කටයුතු පිලිබඳව විගමණික ශ්‍රමිකයන් දැනුවත් කිරීම. | 2.1 වාර්ගිකව මූල්‍ය සාහිත්‍යය පිලිබඳ පුහුණුව ලබන විගමණික ශ්‍රමිකයන් සංඛ්‍යාව අවම වශයෙන් 1000 දක්වා වැඩිවීම.<br><br>2.1 විධිමත් මාර්ගයන් හරහා ප්‍රේෂණ එවනු ලබන විගමණික ශ්‍රමිකයන් සංඛ්‍යාව අවම වශයෙන් 1000 දක්වා වැඩිවීම. | MoFE<br>SLBFE (ප්‍ර. ආ.)<br><br>රාජ්‍ය හා පෞද්ගලික බැංකු (ස. ආ.)<br><br>සිවිල් සමාජ සංවිධාන | | x | x | |

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 2 : නැවත සිය රට පැමිණෙන්නන් ආර්ථිකයට ඒකාබද්ධ කිරීම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉලක්කය : රැකියා සඳහා අවශ්‍ය කුසලතා ලබා ගැනීමට, ව්‍යවසායකත්ව හැකියාවන් සංවර්ධනය කර ගැනීමට සහ රැකියාවල හා තිරසාර ජීවනෝපාය ක්‍රියාකාරකම්වල නියැලීමට විගමණික ශ්‍රමිකයන් හට අවශ්‍ය සහාය ලබා දේ | | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 2 වන ශිල්ප ක්‍රමය : විගමණික ශ්‍රමිකයන් අතර ඉතිරි කිරීම්, ආයෝජන හා මූල්‍ය කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම | | | | | | | | | |
| | 2.2 රාජ්‍ය හා රාජ්‍ය නොවන මූල්‍ය ආයතන විසින් විගමණික ශ්‍රමිකයන් සඳහා සපයනු ලබන සේවාවන් ඉහළ දමා ඇත. | 2.2 තොරතුරු හා ස්වාවන් ලබාගැනීම සඳහා ප්‍රධාන මූල්‍ය ආයතන හා බැංකු විසින් විශේෂ උදවි කවුළු ස්ථාපිත කොට ඇත. | 2.2 විගමණික ශ්‍රමිකයන් සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන තුළ උදවි කවුළු ස්ථාපිත වී ඇත. | | | x | x | |
| 3 වන ශිල්ප ක්‍රමය : නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන් | | | | | | | | | |
| 3. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හරහා පෞද්ගලික හා පවුලේ ආදායම ඉහළ දැමීම හා ස්ථාවර කිරීම. | 3.1 විගමණික ශ්‍රමිකයන්ගේ ව්‍යවසායකයන්ට සහාය දීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ ජාලයන් ස්ථාපිත කොට ඇත. | 3.1 නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා අවශ්‍ය තොරතුරු සපයා දීම සඳහා ආර්ථික සංවර්ධන කටයුතු මෙහෙයවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය ඇති කිරීම.<br><br>3.1 ව්‍යවසායකත්ව කුසලතා හා ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ දැනුම ලබාදීම සඳහා රජයේ හා පෞද්ගලික ආයතන සමග සබඳතා ඇති කිරීම සහ නැවත සියරට පැමිණෙන්නන් විසින් ව්‍යාපාර ආරම්භ කිරීම හා ඒවා විකාශනය. | 3.1 හඳුනාගෙන සහාය ලබා දෙන ලද ව්‍යවසායකයන් සංඛ්‍යාව. | MoFE<br>SLBFE (ප්‍ර. ආ.)<br>IDB (ස. ආ.)<br><br>තරුණ කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය<br><br>කුඩා කර්මාන්ත අමාත්‍යාංශය<br><br>ප්‍රතිපත්ති සැලසුම්, ආර්ථික කටයුතු, ළමා තරුණ හා සංස්කෘතික අමාත්‍යාංශය<br><br>සංවර්ධන ආයතනය (ස. ආ.)<br><br>වාණිජ මණ්ඩලය | | x | x | |

## උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 2 : නැවත සිය රට පැමිණෙන්නන් ආර්ථිකයට ඒකාබද්ධ කිරීම

ඉලක්කය : රැකියා සඳහා අවශ්‍ය කුසලතා ලබා ගැනීමට, ව්‍යවසායකත්ව හැකියාවන් සංවර්ධනය කර ගැනීමට සහ රැකියාවල හා තිරසාර ජීවනෝපාය ක්‍රියාකාරකම්වල නියැලීමට විගමණික ශ්‍රමිකයන් හට අවශ්‍ය සහාය ලබා දේ

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| 3 වන ශිල්ප ක්‍රමය : නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන් | | | | | | | | |
| | 3.2 විගමණික ශ්‍රමිකයන් සඳහා බැංකු / මූල්‍ය ආයතන හරහා පහසුවෙන් ණය ලබා ගත හැකි මාර්ග සකස් කිරීම. | 3.2 මූල්‍ය ආයතන හා එක්ව, තෝරාගත් විගමණික ශ්‍රමික ව්‍යවසායකයන් සඳහා වූ ණය හා මූල්‍ය සේවාවන් ස්ථාපිත කිරීම. | | | | x | x | |
| | | 3.2 මූල්‍ය ආයතන හා එක්ව, තෝරාගත් විගමණික ශ්‍රමික ව්‍යවසායකයන් සඳහා වූ ණය හා මූල්‍ය සේවාවන් ස්ථාපිත කිරීම. | 3.2 විගමණික ශ්‍රමිකයන් සඳහා රාජ්‍ය හා පෞද්ගලික බැංකු මගින් සපයා දී ඇති මුදල් / ණය යෝජනා ක්‍රම සංඛ්‍යාව. | | | | | |
| | | 3.2 තෝරාගත් දිස්ත්‍රික්ක තුළ ILO ව්‍යාපාර මොඩනය / SIYB හා වෙනත් මොඩල ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය | | | | | | |
| | 3.3 විගමණික ශ්‍රමික ව්‍යවසායකත්ව ජාල ස්ථාපිත කොට වෙනත් ව්‍යාපාර සමග ඒවා සම්බන්ධ කොට ඇත. | 3.3 දැනුම අත්දැකීම් හා වෙළඳපොල තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා විගමණික ශ්‍රමික ව්‍යවසායකත්ව ජාලයක් ගොඩ නැගීම හා ප්‍රවර්ධනය කිරීම | | | | | x | |
| | 3.4 ඉහළ ආදායම් ලබන විගමණික ශ්‍රමිකයන් විසින් හඳුනාගෙන ප්‍රවේශ වන ලද විශේෂ ආයෝජන අවස්ථාවන්. | 3.4 ඉහළ ආදායමක් සහිතව කොරියාවේ සිට නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් සඳහා පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව ආයෝජන ඉඩ ප්‍රස්ථා නිර්මාණය කිරීම. | 3.4 පෞද්ගලික අංශය සමග ඒකාබද්ධව ආරම්භ කරන ලද ව්‍යාපාර සංඛ්‍යාව. | | | | x | |
| | 3.5 කාන්තා ව්‍යවසායකත්ව සමිති ආරම්භ කොට ඒවාට අවශ්‍ය ව්‍යාපාරික කුසලතා සහාය ලබාදීම | 3.5 අඩු කුසලතා සහිත කාන්තා ව්‍යවසායකයින් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සකස් කිරීම | 3.5 සාර්ථක කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල නියැලි කාන්තාවන් සංඛ්‍යාව | | | x | x | |

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 2 : නැවත සිය රට පැමිණෙන්නන් ආර්ථිකයට ඒකාබද්ධ කිරීම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඉලක්කය : රැකියා සඳහා අවශ්‍ය කුසලතා ලබා ගැනීමට, ව්‍යවසායකත්ව හැකියාවන් සංවර්ධනය කර ගැනීමට සහ රැකියාවල හා තිරසාර ජීවනෝපාය ක්‍රියාකාරකම්වල නියැලීමට විගමණික ශ්‍රමිකයන් හට අවශ්‍ය සහාය ලබා දේ | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 4 වන ශිල්ප ක්‍රමය : රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් හරහා නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් සඳහා දේශීය රැකියා අවස්ථා ඇති කිරීම | | | | | | | | |
| 4. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය හරහා සියළු කුසලතා මට්ටම්වල ශ්‍රමිකයන් සඳහා දේශීය රැකියා නියුක්ති වැඩසටහන් සකස් කිරීම. | 4.1 විගමණික ශ්‍රමිකයන් සඳහා වන දේශීය රැකියා ඉඩ ප්‍රස්ථා පිලිබඳ තොරතුරු අන්තර්ජාලය හරහා ලබා ගත හැක. | 4.1 ශ්‍රම වෙළඳපොල සමීක්ෂණ සිදු කිරීම හා නැවත සිය රට පැමිණෙන්නන් සඳහා රැකියා වෙළඳපොල ඉඩ ප්‍රස්ථා හඳුනාගැනීම(ගෘහ සේවිකා රැක බලා ගන්නන්, පිරිසිදු කරන්නියන්, ඉදි කිරීම් සේවකයින්, තාක්ෂණ ශිල්පීන් ආදිය)<br><br>4.1 රැකියා ඉඩ ප්‍රස්ථා සඳහා කුසලතා ගැලපීම අන්තර්ජාලය මගින් සිදුකිරීමේ පහසුකම් ඇති කිරීම. | 4.1 නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් සේවයේ යොදවන සේවායෝජකයන් සංඛ්‍යාව 4.2% පෞද්ගලික අංශයෙන් වාර්තා වීම. | TVEC (ප්‍ර. ආ.)<br>MoFE<br>SLBFE (ප්‍ර. ආ.)<br><br>වානිජ මණ්ඩලය<br><br>පෞද්ගලික බැංකු<br><br>ජෝන් කීල්ස්<br>කාගිල්ස් ඩෙම්රෝ<br>ඉදිකිරීම් අංශය<br>සමාගම්, හෝටල්<br>පෞද්ගලික රෝහල් ආදිය<br>අවසරලත් විදේශ රැකියා නියෝජිත ආයතන | | x | x | |



නැවත සිය රට
පැමිණෙන්නන්ගේ හා
ඔවුන්ගේ පවුල්වල
සාමාජිකයන්ගේ
භෞතික හා මනෝවිද්‍යාත්මක
සුභසිද්ධිය

උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 3

## නැවත සිය රට පැමිණෙන්නන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ භෞතික හා මනෝවිද්‍යාත්මක සුභසිද්ධිය

විගමණික ශ්‍රමිකයන්ගේ භෞතික හා මනෝවිද්‍යාත්මක සුභසිද්ධිය අන්තර්ග්‍රහණයේ ප්‍රමුඛතා ක්ෂේත්‍රයකි. භෞතික හා මනෝවිද්‍යාත්මක සුභසිද්ධිය විගමණික ශ්‍රමිකයන් පමණක් නොව ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් දක්වා ද විහිදිය යුතුය. විගමණික ශ්‍රමිකයන්ගේ භෞතික හා මනෝවිද්‍යාත්මක සුභසිද්ධිය සංක්‍රමණ චක්‍රයේ සියළු අදියරයන්, පිටත්වීමට පෙර, සේවාස්ථ, නැවත සිය රට පැමිණීම හා අන්තර්ග්‍රහණය ආවරණය කිරීම ඉතා වැදගත්ය.

ක්‍රමෝපායයන්

3.1 විගමණික සේවක සෞඛ්‍ය ප්‍රතිපත්තියේ නියම කොට ඇති සෞඛ්‍ය සේවාවන්ට (ප්‍රාථමික, ද්විතියික හා තෘතිය) ප්‍රවේශය තහවුරු කිරීම සඳහා පුළුල් වැඩසටහනක් සකස් කිරීම.

3.2 විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා මනෝ සමාජීය සහාය වැඩසටහනක් සකස් කිරීම.

## උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 3 : නැවත සිය රට පැමිණෙන්නන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ භෞතික හා මනෝවිද්‍යාත්මක සුභසිද්ධිය

**ඉලක්කය : පිටත්වීම් පූර්ව, පිටත්වීම්, සේවාස්ථ නැවත සිය රට පැමිණීම හා සමාජයට ඒකාබද්ධ කිරීම යන සංක්‍රමණ චක්‍රයේ සියළු අදියරයන්හිදී විගමණික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමජිකයන්ගේ භෞතික හා මානසික සෞඛ්‍යය තහවුරු කිරීම**

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| **1 වන ක්‍රමවේදය : විගමණික ශ්‍රමික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළ දක්වා ඇති සෞඛ්‍ය සේවාවන් (ප්‍රාථමික, ද්විතියික හා තෘතීය) හට ප්‍රවේශය තහවුරු කිරීම** | | | | | | | | |
| 1. විගමණිකයන්, ඔවුන්ගේ පවුලේ සමාජිකයන් සහ රැකබලාගන්නන් සෞඛ්‍ය ප්‍රතිප්තතිය මගින් නිශ්චය කොට දක්වා ඇති සෞඛ්‍ය සේවාවන් හට ප්‍රවේශය තහවුරු කිරීම සඳහා පූර්ණ වැඩසටහන් සකස් කිරීම. | 1.1 විගමණික ශ්‍රමිකයන් සඳහා වූ විශේෂඥ සෞඛ්‍ය රැකවරණ ජාතික වැඩපිලිවෙල දැනට ක්‍රියාත්මකයි. | 1.1 පිටත්වීම් පූර්ව අදියරේදී විගමණික ශ්‍රමිකයින්ගේ කුසලතා තක්සේරු කිරීම සඳහා වන ජාතික සෞඛ්‍ය හා යෝග්‍යතා මාර්ගෝපදේශ සකස් කිරීම හා එක් එක් විගමණික ශ්‍රමිකයා වෙනුවෙන් පෞද්ගලික සෞඛ්‍ය වාර්තා (පෞ. සෞ. වා) සකස්කිරීම.<br><br>1.1 පිටත්වීම් පූර්ව පුහුණුවේදී සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි ඇතුලත් කිරීම හා ලිංගාශ්‍රිතව බෝවන රෝග හා HIV පිලිබඳ ස්වේච්ඡා පරීක්ෂණ පිලිබඳ තොරතුරු හා උපදේශනය ලබා දීම. | 1.1 පිටත්වීම් පූර්ව අදියරේදී විශේෂඥ වෛද්‍ය රැකවරණ ලබාගත් විගමණික ශ්‍රමිකයන් සංඛ්‍යාව 1000 කි.<br><br>1.2 පිටත්විම් පූර්ව අදියරේදී විගමණික ශ්‍රමිකයන්ගේ සෞඛ්‍යය හා යෝග්‍යතාවය තක්සේරු කිරීමෙ ජාතික මාර්ගෝපදේශයන් සකස් කොට ඇත.<br><br>1.1 ලිංගාශ්‍රිතව බෝවන රෝග හා HIV පරීක්ෂාව සිදු කර ගැනීම සඳහා 200 ක විගමනික ශ්‍රමිකයින් තොරතුරු සපයා ඇත. | සෞඛ්‍ය අමාත්‍යාංශය (ප්‍ර.ආ.) පළාත් හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා<br><br>විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය (ප්‍ර. ආ.)<br><br>SLBFE හා සහන පියස<br><br>රැකියා සඳහා යෝග්‍යතාවය තක්සේරු කිරීමට පත් කරන ලද මානසික වෛද්‍ය වෘත්තිකයන් සහ SLBFE<br><br>සිවිල් සමාජ සංවිධාන හා බිම් මට්ටමේ ජාලයන් | | X | X | |
| | 1.2 සමෝධානික රැකවරණ සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කර ඇති අතර විගමණික ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයන් සමග අධීක්ෂණය කෙරේ. | 1.2 SLBFE කාර්යමණ්ඩලය හා සෞඛ්‍ය කාර්යමණ්ඩල මගින් ප්‍රා. ලේ. කො. මට්ටමින් තෝරාගත් විගමණික ශ්‍රමික නිවාස 30 ක රැකවරණ සැලසුම් සම්බන්ධීකරණය නියමු සමාලෝචනය.<br><br>1.2 නියමු සමාලෝචනය මත පදනම්ව දිවයින පුරා විගමණික ශ්‍රමික පවුල් සඳහා සමෝධානික රැකවරණ සැලසුම ක්‍රියාත්මක කිරීම. | 1.2 සමෝධානික රැකවරණ සැලසුම් ඇති විගමණික ශ්‍රමික පවුල් සංඛ්‍යාව 50%කි. | | | | X | |

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 3 : නැවත සිය රට පැමිණෙන්නන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ භෞතික හා මනෝවිද්‍යාත්මක සුභසිද්ධිය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඉලක්කය : පිටත්වීම් පූර්ව, පිටත්වීම්, සේවාස්ථ නැවත සිය රට පැමිණීම හා සමාජයට ඒකාබද්ධ කිරීම යන සංක්‍රමණ චක්‍රයේ සියළු අදියරයන්හිදී විගමණික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමජිකයන්ගේ භෞතික හා මානසික සෞඛ්‍යය තහවුරු කිරීම | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 1 වන ක්‍රමවේදය : විගමණික ශ්‍රමික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළ දක්වා ඇති සෞඛ්‍ය සේවාවන් (ප්‍රාථමික, ද්විතියික හා තෘතීය) හට ප්‍රවේශය තහවුරු කිරීම | | | | | | | | |
| | 1.3 වෛද්‍ය උපදේශන කාර්ය මණ්ඩල පත් කොට තොරතුරු කවුළු ශක්තිමත් කොට ඇත. | 1.3 සහන පියස හා ගුවන් තොටුපලේ වෛද්‍ය ප්‍රතිකාර පහසුකම් ශක්තිමත් කිරීම හා ශ්‍රමිකයන්ගේ පහසුව තකා එම ස්ථානවල සේවා මුර ක්‍රමයට වෛද්‍ය කාර්ය මණ්ඩල හා උපදේශන කාර්ය මණ්ඩල සේවයේ යෙදවීම.<br><br>1.3 නැවත සිය රට පැමිණි පසු සෞඛ්‍ය තක්සේරුවක් සිදු කර ගැනීමට හා අවශ්‍ය වෙතොත් යොමු කිරීම් සිදු කරවා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් විගමණික ශ්‍රමිකයන් සඳහා සකස් කොට ඇත. | 1.3 විගමණික ශ්‍රමිකයන් 3000 ක් ගුවන් තොටුපලේ / සහන පියසේ සේවාවන් ලබාගෙන ඇත. | | | x | x | |
| | 1.4 වේදනාත්මක අත්දැකීම් වලට මුහුණ දී නැවත සියරට පැමිණි ශ්‍රමිකයින් සම්බන්ධ විශේෂ සිද්ධි ආමන්ත්‍රණය කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කොට ඇත. | 1.4 පුද්ගල ජාවාරම් වලට, අපයෝජනයට හෝ සූරාකෑම්වලට ලක්ව නැවත සිය රට පැමිණි ශ්‍රමිකයන් සඳහා විශේෂ වැඩසටහන් හා යොමුකිරීම් යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.<br><br>1.4 විශේෂ අවශ්‍යතා සහිත නැවත සිය රට පැමිණි විගමණික ශ්‍රමිකයන් සඳහා ප්‍රජා පසු විපරම්.<br><br>. | 1.4 නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය වෙනුවෙන් කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන සංඛ්‍යාව. | | | | | |

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 3 : නැවත සිය රට පැමිණෙන්නන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ භෞතික හා මනෝවිද්‍යාත්මක සුභසිද්ධිය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඉලක්කය : පිටත්වීම් පූර්ව, පිටත්වීම්, සේවාස්ථ නැවත සිය රට පැමිණීම හා සමාජයට ඒකාබද්ධ කිරීම යන සංක්‍රමණ චක්‍රයේ සියළු අදියරයන්හිදී විගමණික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමජිකයන්ගේ භෞතික හා මානසික සෞඛ්‍යය තහවුරු කිරීම | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 2 වන ශිල්ප ක්‍රමය : විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා මනෝ සමාජීය සහාය වැඩසටහන් සකස් කිරීම | | | | | | | | |
| 2. විගමණික ශ්‍රමිකයන් ඔවුන්ගේ පවුල් හා ප්‍රජාව සමග ඉතා සුහදව කල් ගෙවයි. | 2.1 විගමණික ශ්‍රමිකයන් අතර සිටින මිනිස් ජාවාරම් වලට හසු වූ වින්දිතයන් හඳුනා ගෙන ඔවුන් සදහා මනෝ සමාජීය සහය ලබා දීම සඳහා වූ යාන්ත්‍රණයන් හා ක්‍රියාවලී ස්ථාපිත වී ඇත. | 2.1 සහන පියස ඇතුළු දැනට ඇති මනෝ සමාජීය සහාය වැඩසටහන් සමාලෝචනය කිරීම හා නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා වන ධාරිතාවන් වර්ධනය කිරීම. | 2.1 නැවත සිය රට පැමිණි විගමනික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමජිකයන් 300ක් මනෝ සමාජීය සේවා හා උපදේශන සේවා ලබා ගෙන ඇත.<br><br>2.1 නිලධාරීන් හා වෙනත් ග්‍රාමීය ප්‍රජාව තුළ විවිධ ගැටළු (මානසික හා ශාරීරික) සඳහා ප්‍රතිකාර ලබාගත් විගමණික ශ්‍රමිකයන් සංඛ්‍යාවකි. | MoFE<br>SLBFE<br>හා සහන පියස (ප්‍ර. ආ.)<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය (ස. ඇ.)<br><br>සමාජ සේවා අමාත්‍යාංශය (ස. ආ.)<br><br>කාන්තා කටයුතු අමාත්‍යාංශය (ස. ආ.)<br><br>විද්වතුන්<br><br>CSO (ස. ආ.)<br><br>මනෝ වෛද්‍යවරුන්ගේ සංගමය හා වෙනත් අදාල වෘත්තිය සංවිධාන | | X | X | |
| | 2.2 වින්දිතයන් ආරක්ෂා කිරීම පිලිබඳ රජයේ අනුමත ආරක්ෂණ ක්‍රමවේදයන් හා යොමු කිරීම්. | 2.2 සේවාවන් සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල මට්ටමින් ඇති උපදේශන සේවාවන් ඒකාබද්ධ කිරීම. | | | | X | X | |
| | 2.3 විගමණික ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා මනෝ සමාජීය සහාය ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන ජාලයන්. | 2.3 විගමණික ශ්‍රමිකයන් සඳහා එලදයී මනෝ - සමාජීය සහාය ලබාදීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ මට්ටමින් ඇති උපදේශක සේවාවන් ඒතාබද්ධ කිරීම. | | | | X | X | |

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍රය 3 : නැවත සිය රට පැමිණෙන්නන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ භෞතික හා මනෝවිද්‍යාත්මක සුභසිද්ධිය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඉලක්කය : පිටත්වීම් පූර්ව, පිටත්වීම්, සේවාස්ථ නැවත සිය රට පැමිණීම හා සමාජයට ඒකාබද්ධ කිරීම යන සංක්‍රමණ චක්‍රයේ සියළු අදියරයන්හිදී විගමණික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමජිකයන්ගේ භෞතික හා මානසික සෞඛ්‍යය තහවුරු කිරීම | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 2 වන ශිල්ප ක්‍රමය : විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා මනෝ සමාජීය සහාය වැඩසටහන් සකස් කිරීම | | | | | | | | |
| | | 2.3 විදේශ දූත මණ්ඩල විසින් ආරක්ෂක නිවාස වෙත ගොස් එක්රැස් කොට ගත් තොරතුරු මත පදනම්ව විවිධ පීඩාවන්ට පත් වූ ශ්‍රමිකයන් ප්‍රමුඛතා පදනම මත නැවත සිය රට බලා පිටත් කරවීම සහ එසේ පැමිණි පසු අදාල ප්‍රතිකාර යාන්ත්‍රණයන් වෙත යොමු කිරීම. | | | | | | |





# විගමණික ශ්‍රමිකයන් සවිබල කිරීම

උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 4

## විගමණික ශ්‍රමිකයන් සවිබල කිරීම

සංක්‍රමණය වීමට පෙර නව පරිසරයට හා සේවා ස්ථානයට අනුගත වීමේදී ගැටළු ඇතිවීම අවම කරගැනීම සඳහා විගමණික ශ්‍රමිකයා විසින් තම සත්කාරක රටෙහි සංස්කෘතිය හා සාමාන්‍ය නීති පද්ධතිය පිළිබඳව මනා අවබෝධයක් ඇති කරගත යුතුය. නැවත සිය රට පැමිණීම සඳහා අවශ්‍ය පහසුකම් මෙන්ම සිය රටෙහි සහ ගමනාන්ත රටෙහි නීති ආධාර සේවාවන්ට ප්‍රවේශය ලබාදීම යෝජනා කෙරේ. අන්‍යොන්‍ය වශයෙන් එකඟ වන ලද සම්මත සේවා කොන්ත්‍රාත්තු හරහා විගමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු කළ යුතුය. විදේශ දූත කාර්යාල හරහා විගමණික ශ්‍රමිකයන් හට අනතුරකින් මිදුනු පුද්ගලයින් සඳහා වන සහාය සේවාවන්ට හා සුරක්ෂිත හා ගෞරවනීය ලෙස නැවත සිය රට පැමිණීමට අවශ්‍ය පහසුකම් තහවුරු කොට දිය යුතුය.

ක්‍රමෝපායන්

4.1 අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්කිරීම හරහා විගමණික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම.

4.2 ගමනාන්ත රටවල සිට නැවත සිය රට පැමිණි පසු විගමණික ශ්‍රමිකයන් නෛතික වශයෙන් සවිබල ගැන්වීම.

4.3 සත්කාරක රට තුලදී විගමණික ශ්‍රමිකයාගේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම.

## උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 4 : විගමණික ශ්‍රමිකයන් සිවිල් හා දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම

ඉලක්කය : සමාජ ආර්ථික හා සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රතිපත්ති තීරණ හා පිලිවෙත් සඳහා බලපෑම් කිරීම පිණිස විගමණික ශ්‍රමිකයන් සවිබලගැනවීම හා ඔවුන් හට ඒ සඳහා සහාය වීම

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| **1 වන ශිල්ප ක්‍රමය : අයිතිවාසිකම් පිලිබඳ දැනුවත්කිරීම හරහා විගමණික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම** | | | | | | | | |
| 1. ප්‍රමිතියෙන් යුත් ගිවිසුම්වල ඇතුලත් විධිවිධාන සම්බන්ධයෙන් හිමිකම් කියාපෑමට අවශ්‍ය ශක්තිය විගමණික ශ්‍රමිකයන් විසින් ලබා ගනී. | 1.1 විගමණික ශ්‍රමකයන්ගේ අයිතිවාසිකම් හා සත්කාරක රටේ සමාජ ආර්ථික හා නීති පිළිබඳ දැනුම පූර්ව පිටත්වීම් පුහුණුව තුළ ඇතුලත්ය. | 1.1 විගමණික ශ්‍රමිකයන් සඳහා අයිතිවාසිකම් පිළිබඳ හා සුරක්ෂිත සංක්‍රමණය පිළිබඳ දැනුවත් කිරීම් සිදු කිරීම හා ප්‍රමිතීන් තහවුරු කිරීම. | 1.1 විගමණික ශ්‍රමිකයන් අයිතිවාසිකම් ඉල්ලා සිටීම 15% කින් ඉහළ ගොස් ඇත.(SLBFE සේවාවන් ලබා ගැනීම) වාර්ශිකව ඉහල යාම. | SLBFE, MoFE (ප්‍ර. ආ.)<br>අධිකරණ අමාත්‍යාංශය (ස. ආ.)<br>ජාත්‍යන්තර ආයතන (ස. ආ.)<br>වෘත්තිය සමිති (ස. ආ)<br>ප්‍රාදේශීය මට්ටමේ සමුපකාර සමිති (ස. ආ.)<br>CSO (ස. ආ.) | x | x | x | |
| | 1.2 නැවත සිය රට පැමිණෙන විගමණික ශ්‍රමිකයන්ගේ එකමුතුවක් ගොඩනැගී ඇත. | 1.2 ප්‍රතිපත්ති හා පිළිවෙත් සඳහා බලපෑම කිරීම පිණිස විගමණික ශ්‍රමිකයන්ගේ හඬ අවදි කරවන කම්කරු සමිති හා සාමූහිකයන් වල සක්‍රිය සාමාජිකයන් බවට පත්කිරීම තහවුරු කිරීම.<br>1.2 සාමූහිකයන් මගින් විගමණික ශ්‍රමිකයන්ගේ ඡන්ද අයිතිය පිළිබඳව උද්දේශන කටයුතු සිදු කිරීම. | 1.2 විගමණික එකමුතුවල සාමාජිකත්වය 20% කි. | | | x | x | |
| | 1.3 විගමණික ශ්‍රමික සාමාජිකත්වය සඳහා අවශ්‍ය විධිවිධාන කම්කරු වෘත්තිය සමිති විසින් සකස් කොට ඇත. | 1.3 ආපසු පැමිණි විගමණික ශ්‍රමිකයන්ට සාමාජිකත්වය පිරිනැමීම සඳහා වෘත්තිය සමිති සහ සමාජ නිලධාරින්ගේ ජාලය සමග සාකච්ජා කිරීම. | 1.3 කම්කරු වෘත්තිය සමිතිවල සාමාජිකත්වය 1000 කි. | | | x | x | |

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 4 : විගමණික ශ්‍රමිකයන් සිවිල් හා දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඉලක්කය : සමාජ ආර්ථික හා සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රතිපත්ති තීරණ හා පිලිවෙත් සඳහා බලපෑම් කිරීම පිණිස විගමණික ශ්‍රමිකයන් සවිබලගැනවීම හා ඔවුන් හට ඒ සඳහා සහාය වීම | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 2 වන ශිල්පක්‍රමය : ගමනාන්ත රටවල නැවත සිය රට පැමිණි පසු විගමණික ශ්‍රමිකයන් නෛතික වශයෙන් සවිබල ගැන්වීම | | | | | | | | |
| 2 නීති විධිවිධාන හරහා විගමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා ගෞරවය තහවුරු වී ඇත. | 2.1 තම රටේ හා සත්කාරක රටේ ඇති නීති සේවා පිලිබඳ දත්ත පද්ධතිය විදේශ තානාපති කාර්යාල සමග සබඳතා ස්ථාපිත කොට ඇත. | 2.1 සිය රටේ හා සත්කාරක රටේ ඇති නීති සේවාවන් සිතියම්ගත කිරීම හා සබඳතා ගොඩනැගීම.<br>2.1 රජයේ ආයතන, NGO / වෘත්තිය සමිති, වෙනත් නීති යාන්ත්‍රණ හා සේවා සපයන්නන් අනෙකුත් සේවා සපයන්නන්. | 2.1 දේශීය වශයෙන් නිති සේවාවන්ට ප්‍රවේශ වූ විගමණික ශ්‍රමිකයන් සංඛ්‍යාව වාර්ෂිකව 10% කි. | SLBFE<br>MoFE (ප්‍ර. ආ.)<br>අධිකරණ අමාත්‍යාංශය (ස. ආ.)<br>INGO (ස. ආ.)<br>CSO (ස. ආ.)<br>අනෙකුත් නීති සම්බන්ධ යාන්ත්‍රණ (ස. ආ.)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (ස. ආ.)<br>වතු සමාගම් (ස. ආ.) | | x | x | |
| | 2.2 වතුකරයේ ප්‍රදේශ තුළ "එක් වහලක් යට නීති සහාය" ආයතන ස්ථාපිත කොට ඇත. | 2.2 ගිවිසුම්ගත වගකීම් ලබාගැනීම සඳහා වැවිලි කේෂත්‍රයේ සම්ක්‍රමණික සේවකයින් සදහා විශේෂිත නීතිමය පතිපාදන සදහා වූ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | 2.2 කළමනාකාරිත්වයන් වතු සමාගම් විසින් කොන්ත්‍රාත් විධිවිධානවලට අනුකූලව කටයුතු කරන ලද විගමණික සංඛ්‍යාව කි.ර | | | x | x | |

## උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 4 : විගමණික ශ්‍රමිකයන් සිවිල් හා දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම

ඉලක්කය : සමාජ ආර්ථික හා සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රතිපත්ති තීරණ හා පිලිවෙත් සඳහා බලපෑම් කිරීම පිණිස විගමණික ශ්‍රමිකයන් සවිබලගැනවීම හා ඔවුන් හට ඒ සඳහා සහාය වීම

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| 3 වන ශිල්පක්‍රමය : සත්කාරක රට තුලදී විගමණික ශ්‍රමිකයාගේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම | | | | | | | | |
| 3. ප්‍රමිතිගත කොන්ත්‍රාත් හරහා විගමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු කොට ඇත. | 3.1 සත්කාරක රට තුළ ප්‍රමිතිගත කොන්ත්‍රාත්වලට අනුකූලව කටයුතු කරන අතර ඒවා නිතිපතා අධිකරණයට ලක් කෙරේ. | 3.1 ගල්ෆ් සහායෝගීතා සභා සමග ඒකාබද්ධව ගල්ෆ් කලාපයේ සේවයේ යෙදී සිටින ගෘහසේවිකාවන් සඳහා ප්‍රමිතිගත රැකියා කොන්ත්‍රාත්තු නියාමනය කිරීම.<br><br>3.2 දැනට ඇති කම්කරු ගිවිසුම් / සේවයේ යෙදවීමේ කොන්ත්‍රාත්තු සමාලෝචනය කිරීම හා විගමණික ශ්‍රමිකයන් සඳහා ආරක්ෂාව හා ගෞරවය ලබා දීම.<br><br>3.3 විශේෂයෙන් සත්කාරක රටේ කම්කරු නීති මගින් ආවරණය නොවන ශ්‍රමිකයන්ගේ සේවා කොන්ත්‍රාත්තු සත්කාරක රට තුලදී අධීක්ෂණයට ලක් කිරීම ක්‍රියාත්මක කිරීම. | 3.1 GCC රටවල් සමග ගෘහ සේවිකාවන් සඳහා ප්‍රමිතිගත රැකියා කොන්ත්‍රාත්තු සම්බන්ධ අවබෝධතා ගිවිසුම් හෝ ඒකඟතාවයන්. | MoFE (ප්‍ර. ආ.)<br><br>MoFE (ස. ආ.) | | | x | |



නැවත සිය රට පැමිණීමේ
හා අන්තර්ග්‍රහණය කිරීමේ
ක්‍රියාවලිය ඵලදායී
ලෙස කළමනාකරණය කිරීම

උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 5

## නැවත සිය රට පැමිණීමේ හා අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම

විගමණික සේවා ක්ෂේත්‍රය තුළ හඳුනාගනු ලැබූ ප්‍රධාන හිඩැසක් වන්නේ තොරතුරු කළමනාකරණය ප්‍රමාණවත් නොවීමයි. ජාතික හා උප ජාතික මට්ටමින් තොරතුරු එකතු කිරීමේ වාර්තා කිරීමේ හා ගෙන්වා ගැනිමේ විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. ක්‍රමෝපායික මැදිහත්වීමක් අවශ්‍ය වන්නා වූ ප්‍රධාන ක්ෂේත්‍රයක් වන්නේ සංක්‍රමණ ක්ෂේත්‍රයේ සියළු ස්ථරයන්හි සේවයේ නියැලි සිටින නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීමයි. ඒජන්සි කාර්ය මණ්ඩල, සේවා සපයන්නන්, සිවිල් සමාජ සංවිධාන ජාල සහ වෘත්තිය සමිති ආදී ප්‍රධාන පාර්ශවකරුවන්ගේ දැනුම හා කුසලතා ඉහළ දැමීම ඉතා ඉක්මනින් සිදු කළ යුතු කාර්යයක් වන්නේ එය නැවත සිය රට පැමිණීමේ හා අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු වඩා හොඳින් කිරීමට ඉවහල් වන බැවිනි. එසේම, විගමණික ශ්‍රමිකයන් හට සැපයෙන සේවාවන් සම්බන්ධීකරණය කිරීම හා සැලසුම් කිරීම ඉතා අවශ්‍ය වන අතර ඒවා ඵලදායී වීම තහවුරු කිරීම සඳහා වු පාර්ශවීය ප්‍රවේශයන් ස්ථාපිත කළ යුතුය. එසේම සිවිල් සමාජ සංවිධාන හා වෘත්තිය සමිතිවල කාර්යභාරය ඇගයීමට හා පිලිගැනීමට ලක් කළ යුතුය.

ක්‍රමෝපායන්

5.1 සංක්‍රමණ චක්‍රයේ සියළු අදියරයන්හිදී සංක්‍රමණය පිලිබඳ තොරතුරු කළමනාකරණය හා බෙදා හැරීම.

5.2 සංක්‍රමණ ක්ෂේත්‍රයේ සියලු පාර්ශවකරුවන්ගේ ධාරිතා වර්ධනය කිරීම.

5.3 ඵලදායී සේවා සැපයුම තහවුරු කිරීම සඳහා වූ අන්තර් - ආංශික හා අන්තර් - ආයතන සම්බන්ධීකරණය ඇති කිරීම.

## උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 5 : නැවත සිය රට පැමිණීමේ හා සමාජයට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම

ඉලක්කය : බහු පාර්ශ්වකාර සහභාගිත්වය හරහා ශ්‍රමික සංක්‍රමණයේ නැවත සිය රට පැමිණීමේ හා සමාජයට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය තහවුරු කිරීම

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| **1 වන ශිල්ප ක්‍රමය : විගමණික චක්‍රයේ සියළු අදියරයන්හිදී තොරතුරු කළමනාකරණය හා බෙදාහැරීම** | | | | | | | | |
| 1. ශ්‍රමික සංක්‍රමණ චක්‍රයේ සියළු අදියරයන්හිදී සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳව තොරතුරු කළමනාකරණය හා බෙදා හැරීම. | 1.1 ජාතික හා මධ්‍යගත දත්ත පද්ධති තුළ නැවත සිය රට පැමිණෙන්නන් පිළිබඳ තොරතුරු ඇතුලත්ය. | 1.1 නැවත සිය රට පැමිණෙන්නන් පිලිබඳ තොරතුරු ඒකරාශී කිරීම සඳහා වන මාර්ග සකස් කිරීම හා ඒවා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දත්ත පද්ධතිය තුලට ඇතුලත් කිරීම. | 1.1 ශ්‍රමික සංක්‍රමණය පිලිබඳ තොරතුරු පද්ධතිය මත පදනම්ව ප්‍රතිපත්ති. | SLBFE<br>MoFE (ප්‍ර. ආ.)<br><br>ආගමන හා විගමන දෙපාර්තමේන්තුව (ප්‍ර. ආ.)<br><br>ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (ස. ආ.)<br><br>විදේශ කටයුතු අමාත්‍යාංශය | | x | x | |
| | 1.2 නැවත සිය රට පැමිණෙන්නන් පිළිබඳ මෑත තොරතුරු ඇතුලත් කොට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කොට ඇත. | 1.2 SLBFE කාර්යාලයේ වෙබ් අඩවිය මෑත කාලීන තොරතුරු ඇතුලත් කොට යාවත්කාලීන කොට ඇත. | 1.2 ජාතික දත්ත පද්ධතිය භාවිතා කරනු ලබන පුද්ගලයින් සංඛ්‍යාව නැවත සිය රට පැමිණෙන්නන් පිළිබඳ පද්ධතියක් සකස් කිරීම හා එය නිතිපතා යාවත්කාලීන කිරීම. | ශ්‍රී ලංකා තානාපති කාර්යාලය (ස. ආ.) | | x | x | |
| | | 1.3 සියළු විගමණික ශ්‍රමිකයන් සඳහා ශ්‍රමික හිතවාදී තොරතුරු පැකේජ ඇත. | | | | x | x | |

## උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 5 : නැවත සිය රට පැමිණීමේ හා සමාජයට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම

ඉලක්කය : බහු පාර්ශ්වකාර සහභාගිත්වය හරහා ශ්‍රමික සංක්‍රමණයේ නැවත සිය රට පැමිණීමේ හා සමාජයට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය තහවුරු කිරීම

| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|---|---|---|---|---|
| 2 වන ශිල්ප ක්‍රමය : ශ්‍රමික විගමණ ක්ෂේත්‍රයේ සියළු පාර්ශ්වකරුවන්ගේ ධාරිතා වර්ධනය කිරීම | | | | | | | | |
| 2. බහුපාර්ශ්වකරුවන්ගේ සහයෝගය මත ශ්‍රමික සංක්‍රමණ චක්‍රයේ සියළු අදියරයන් සුදුසුකම්ලත් කාර්යමණ්ඩල විසින් ඵලදායී ලෙස කළමනාකරණය කරනු ලබයි. | 2.1 නැවත සියරට පැමිණීම හා සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය තුළ හිග්නිතව දක්වා ඇති කාර්යභාරයන් පිළිබඳව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ නිලධාරීන් දැනුවත්වී ඇත. | 2.1 පාර්ශ්වකරුවන් හා ඔවුන්ගේ ධාරිතා අවශ්‍යතා හඳුනාගැනීම හා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කොට ක්‍රියාවට නැංවීම. | 2.1 ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් නිලධාරීන් 300 ක් පුහුණු කොට ඇත. | SLBFE<br>MoFE (ප්‍ර. ආ.)<br><br>ධාරිතා වර්ධන ක්ෂේත්‍රයේ විශේෂඥ සේවය සහිත වෘත්තිය ආයතන (ස. ආ.) | x | x | x | |
| | 2.2 නැවත සිය රට පැමිණීමේ ක්‍රියාවලිය ඵලදායී කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය කුසලතා ප්‍රධාන පාර්ශ්වකරුවන් විසින් අත්පත් කොට ගෙන ඇත. | 2.2 පාර්ශ්වකරුවන්ගේ කාර්යසාධනය කාලීනව අධීක්ෂණය කිරීම. | | | | x | x | |

| උප ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 5 : නැවත සිය රට පැමිණීමේ හා සමාජයට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඉලක්කය : බහු පාර්ශ්වකාර සහභාගිත්වය හරහා ශ්‍රමික සංක්‍රමණයේ නැවත සිය රට පැමිණීමේ හා සමාජයට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය තහවුරු කිරීම | | | | | | | | |
| ප්‍රතිඵලය | නිමැවුම | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාර්යසාධන දර්ශක | ප්‍රධාන ආයතන (ප්‍ර.ආ) හා සහාය ආයතන (ස.ආ) | 2016 | 2017 | 2018 | අයවැය |
| 3 වන ශිල්ප ක්‍රමය : ශ්‍රමික විගමණ ක්ෂේත්‍රයේ ඵලදයි සේවා සැපයීම සඳහා අන්තර් ආංශික හා අන්තර් ආයතන සම්බන්ධීකරණය ගොඩ නැගීම | | | | | | | | |
| 3. ශ්‍රමික සංක්‍රමණ ක්‍රියාවලිය ඵලදායී හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ ප්‍රතිලාභ විගමණික ශ්‍රමිකයන් විසින් භුක්ති විඳී | 3.1 විගමණික ශ්‍රමිකයන් සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමේදී බහු පාර්ශ්වකාර සම්බන්ධතාවය තහවුරු කිරීම සඳහා වූ ඒකාබද්ධ යාන්ත්‍රණ ස්ථාපිත කොට ඇත | 3.1 ශ්‍රමික සංක්‍රමණ ක්‍රියාවලිය තුළ සිවිල් සංවිධාන වෘත්තිය සමිති, ආගමික සංවිධාන සහ අවසරලත් විදේශ රැකියා ඒජන්සි වල සහභාගිත්වය ඵලදායී ලෙස නැවත සිය රට පැමිණීමේ ක්‍රියාවලිය තුළ ප්‍රවර්ධනය කිරීම. | 3.1 අන්තර් ආංශික සම්බන්ධීකරණ යාන්ත්‍රණ ස්ථාපිත කොට කාලීන රැස්වීම් පවත්වා ඇත. | SLBFE<br>MoFE (ප්‍ර. ආ.)<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය<br><br>සමාජ සේවා අමාත්‍යාංශය<br><br>නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය<br>කාන්තා කටයුතු අමාත්‍යාංශය | x | x | x | |
| | 3.2 ශ්‍රමික සංක්‍රමණ ක්‍රියාවලිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සදහා අන්තර් අමාත්‍යංශ, ඒකාබද්ධතාවය ස්ථාපිත කිරීම. | 3.2 ජාත්‍යන්තර, ජාතික හා උපජාතික ආදි සියළු මට්ටම්වලදී සම්බන්ධීකරණය සඳහා SLBFE ඒකාබද්ධතාවය සහිත අන්තර් ආංශික / අමාත්‍යාංශ මට්ටමේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. | 3.2 විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග ඒකාබද්ධව කටයුතු කරන ආයතන සංඛ්‍යව 300 කි. | ජාත්‍යන්තර සංවිධාන හා INGO<br><br>අදාල CSO හා CSO ජාල / සාමූහිකයන්<br>අවසරලත් රැකියා නියුක්ති ඒජන්සි | x | x | x | |
| | 3.3 විගමණික ශ්‍රමිකයන් හදිසියේ අදාල ස්ථානයෙන් ඉවත් කිරීම පිළිබඳව අදාල ආයතන සමග ඵලදායී ලෙස සාමූහික වශයෙන් කටයුතු කිරීම. | 3.3 රජයේ ආයතන හා ජාත්‍යන්තර සංවිධානවල සහභාගිත්වය ඇතිව විගමණික ශ්‍රමිකයන්ගේ හදිසි පිටත් වීමේ අවස්ථා තත්ත්වයන් තක්සේරු කිරීම සඳහා වන හදිසි අවස්ථා සැලසුමක් සකස් කිරීම. | 3.3 විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග ඒකාබද්ධව කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන හා වෙනත් ආයතන සංඛ්‍යාව.<br><br>3.4 හදිසි අවස්ථා සැලසුම් සකස් කොට ඇත. | | | x | x | |

## නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුම ක්‍රියාවට නැංවීමේ ක්‍රමවේදය

- විදේශ රැකියා නියුක්ති අමාත්‍යාංශය (MoFE) විසින් අනුමත කොට ඇති පරිදි, නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුමට ක්‍රියාවට නැංවීමේ ප්‍රධාන ආයතනය වන්නේ ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයයි (SLBFE) නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ විශේෂ ඒකකයක් ස්ථාපිත කොට ඒ සඳහා කාර්යමන්ඩල බඳවාගෙන විදේශ රැකියා සියුක්ති අමාත්‍යාංශයේ නිර්දේශය හා මාර්ගෝපදේශය මත එහි කටයුතු ආරම්භ කිරීම සිදු කරනු ලැබේ.

- නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිලිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුම ක්‍රියාවට නැංවීමේ සැලසුමේ දක්වා ඇති පරිදි SLBFE කාර්යාංශය විසින් සහාය ආයතනවල නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ක්‍රියාකාරී කමිටුවක් ස්ථාපිත කිරීම යෝජනා කෙරේ. විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ මගපෙන්වීම යටතේ ප්‍රධාන හා සහාය ආයතන විසින් යොමු කිරීම් අනුදේශ සකස් කොට එකඟ වීම නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ ජාතික උපදේශ කමිටුව හා අදාල අනු කමිටුව විසින් උක්ත මෙහෙයුම් කමිටුව සඳහා අවශ්‍ය මාර්ගෝපදේශය හා සහාය ලබා දෙනු ඇත.

- එක් එක් ප්‍රධාන කේන්ද්‍රය යටතේ සවිස්තරාත්මක මෙහෙයුම් සැලසුම් සකස් කිරීම හා අවශ්‍ය සම්පත් ලබාගැනීම සඳහා වන සැලසුම් සකස් කිරීම පිළිබඳ වගකීම දාල මෙහෙයුම් කමිටුව වෙත පැවරේ. ජාතික ක්‍රියාකාරී සැලසුම තුළ දක්වා ඇති ශිල්පක්‍රම, නිමැවුම් හා කාර්යසාධන දර්ශක වලට අනුව මෙහෙයුම් සැලසුම් සකස් ළ යුතු බව සැලකිය යුතුය. මෙහෙයුම් සැලසුම් හා සවිස්තරාත්මක අයවැය MoFE හා SLBFE විසින් අනුමත කළ යුතුය.

- MoFE සුපරීක්ෂණය යටතේ ජාතික ක්‍රියාකාරී සැලසුම ක්‍රියාවට නැංවීමේ සමස්ත වගකීම පැවරෙනුයේ SLBFE වෙතය. සහාය ආයතනවල සහයෝගිතාවය මත ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අධීක්ෂණ යාන්ත්‍රණ සකස් කොට එය අධීක්ෂණය කිරීමේ වගකීම නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ විශේෂ ඒකකය වෙත පැවරිය යුතුය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය නැවත සිය රට පැමිණීම හා නැවත සමාජයට ඒකාබද්ධ කිරීම පිළිබඳ විශේෂ ඒකකය ශ්‍රී ලංකා විදේශ ස්වා නියුක්ති කාර්යාංශය පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ විමධ්‍යගත ව්‍යුහයන් සමග සම්බන්ධ කළ යුතුය.

කාලීන අධීක්ෂණය

- ප්‍රධාන සහ සහාය ආයතන ඇතුලත් ක්‍රියාකාරී කමිටුවේ සැලසුම් හා අධීක්ෂණ රැස්වීම් MoFE ලේකම් වරයාගේ ප්‍රධානත්වයෙන් කාර්තුමය වශයෙන් පැවැත්වීම.

- SLBFE විසින් ඉහත රැස්වීම් වල කාර්තුමය පසුවිපරම් වාර්තා සකස් කොට ඒවා SLBFE කළමනාකරණය වෙත ඉදිරිපත් කිරීම.

- SLBFE විසින් MoFE වෙත ද්විවාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.

- නිමැවුම හා ක්‍රියාවට නැංවීමේ මැදි අවස්ථාවේ කාර්යසාධනය පදනම් කොට ගත් මැද කාලීන සමාලෝචන.

- පසුගිය වසර තුනේ අවසන් කාර්තුවේ අවසන් ඇගයීම හා අවසන් සමාලෝචනයේ නිර්දේශ මත පදනම්ව ඉදිරි වසර තුන සඳහා ජාතික ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම හා එය ආරම්භ කිරීම.

# අනුප්‍රතිපත්තියේ අතුලත් නිර්වචන

## නැවත සිය රට පැමිණෙන්නෙකු පිළිබඳ නිර්වචනය :

තාවකාලික විගමණික ක්‍රියාවලියේ අවසාන අදියර වන්නේ විගමණික ශ්‍රමිකයෙකු නැවත සිය මව්රට බලා පැමිණීමයි. එසේ නැවත සිය මව්රට බලා පැමිණීම ස්වේච්ඡාවෙන් හෝ බලහත්කාරයෙන් යන දෙආකාරයෙන් සහ තනි පුද්ගල සහ ඇතැම්විට පුද්ගල කණ්ඩායම් ලෙස සිදු විය හැකිය.

## බලහත්කාරයෙන් හෝ අකැමැත්තෙන් නැවත සිය රට බලා පිටත් කිරීම

සේවායෝජකයා විසින් නීති විරෝධී ලෙස සේවය අවසන් කිරීම හෝ හදිසියේ හෝ අසාධාරණ ලෙස සේවය අවසන් කිරීම සම්බන්ධ තත්ත්වයන් අකමැත්තෙන් නැවත සිය රට බලා පිටත් කිරීම තුල ඇතුලත්ය. සේවායෝජකයා හෝ ඒජන්ත විසින් විගමණික ශ්‍රමිකයා අපයෝජනයට හෝ සූරාකෑමට ලක් කිරීම, සේවායෝජකයා විසින් ශ්‍රමිකයා අත් හැර දැමීම, රැකියාව අහිමිවීම, සේවා අවසරපත්‍රය හෝ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්ව ගොස් නැවත අලුත් කිරීමට නොහැකිවීම ආදිය අකැමැත්තෙන් නැවත සිය රට බලා පිටත් කිරීමට හේතු වේ.

## රටින් නෙරපීම

නැවත සිය රට පැමිණීමට සිදුවීම, රටින් නෙරපීමේ නියෝගයක් මත සිදු විය හැකිය. ගමනාන්ත රටවල් බොහෝ විට ශ්‍රමිකයන් තනි පුද්ගල මට්ටමින් හා ඇතැම්විට පුද්ගල කණ්ඩායම් ලෙස රටින් නෙරපීම සිදු කරයි. අදාල ලේඛන නොමැතිව සංක්‍රමණය කිරීම හෝ අදාල පුද්ගලයා විසින් යම් අපරාධයක්[1] සිදුකිරීම තනි පුද්ගල මට්ටමින් රටකින් නෙරපීම සිදු කිරීමට හේතු වේ.

## ස්වේච්ඡාවෙන් නැවත පැමිණීම

හොඳ ආදායමක් උපයාගෙන, හොඳ ඉතිරියක් ඇතිව තම පවුල සඳහා දීප්තිමත් අනාගතයක්' උදෙසා නැවත සිය රට කරා පැමිණිම විගමණික ශ්‍රමිකයන්ගේ අභිප්‍රාය වේ. විගමණික ශ්‍රමිකයන් හට තම රටේ හා තමන් සේවයේ යෙදී සිටින රටේ තත්ත්වයන් සංසන්දනය කොට නැවත සිය රට පැමිණීම පිලිබඳ තීරණය ගත හැකිය. එසේ ස්වේච්ඡාවෙන් එම තීරණය ගන්නා විට එය නැවත සිය රටට පැමිණිම පිළිබඳ සැබෑ තිරණය බවට පත් වේ.

---

[1] ජාත්‍යන්තර නීතියේ පොදුවේ පිලිගත් මූලධර්මයන්ට අනුව ඇතැම් අවස්ථාවල පුරවැසියෙකු නොවන අයෙකු රටකින් පිටුවහල් කිරීම හෝ නෙරපීම සිදු කළ හැකි අතර, සිය දේශසිමා හරහා පුද්ගලයින් සංචරණය වීම පාලනය කිරීම සඳහා රටවල් විසින් අවශ්‍ය පියවර ගත යුතු බව පිලිගනී, සියළු සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම්වලට ගරු කළ යුතු බව ජාත්‍යන්තර මානව හිමිකම් හා කම්කරු ප්‍රමිතින් තුළ විශේෂ වශයෙන් සඳහන් කොට ඇත. එක් එක් සිද්ධිය සම්බන්ධයෙන් වන නිසි ක්‍රියාවලියක් ඇති අතර සමූහ වශයෙන් පිටුවහල් කිරීම සිදු නොකළ යුතුය.

